# සිංහල

## 13 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

පළමුවන මුද්‍රණය 2010

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපනය ආයතනය

මුද්‍රණය ඃ
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# පෙරවදන

වර්ෂ 2007 දී 6 සහ 10 ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේ සිට එය අ.පො.ස (උ.පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී ඇත. එම නිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් අවස්ථා සම්පාදනයේ දී ගුරුවරුන්ට මහත් සේ ප්‍රයෝජනවත් වනු ඇත.

අ.පො.ස. (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතියික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10,11 ශ්‍රේණි) විෂය මාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10, හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළ යුතු ඉගෙනුම් හා ඉගැන්වීම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස. (උ.පෙළ) විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත්, ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්තාව සලසා තිබේ.මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්‍ෂා කරනුයේ ඒ ඒ විෂයට, ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්වීම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්‍ෂම ලෙස යොදා ගනිමින් අපේක්‍ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් වනු ඇතැයි අපේක්‍ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාප ආයතනය.

## සංදේශය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතා එම ශ්‍රේණිය තුළ දී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල ඔබට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිත ව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම හා මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්ති කාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශය මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙලඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා, අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ද ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශය සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මගපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට ද මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහාකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| උපදේශනය | - | මහාචාර්ය ලාල් පෙරේරා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අධීක්ෂණය | - | විමල් සියඹලාගොඩ මහතා<br>සහාකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය විශේෂඥ උපදෙස් | - | මහාචාර්ය රත්න විජේතුංග මහතා |
| සම්බන්ධීකරණය | - | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>ව්‍යාපෘති නිලධාරි |
| විෂය මාලා කමිටුව | - | මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා<br>මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා<br>මහාචාර්ය රත්න විජේතුංග මහතා<br>මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතා<br>මහාචාර්ය විමල් ජී බලගල්ල මහතා<br>මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා<br>මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා<br>මහාචාර්ය ගාමිණී දැළ බණ්ඩාර මහතා<br>මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා<br>මහාචාර්ය රෝහිණී පරණවිතාන මහතා<br>ආචාර්ය නන්දසේන ගමාච්චි මහතා<br>විමල් සියඹලාගොඩ මහතා<br>එස්.ඕ. ප්‍රනාන්දු මහතා<br>රෝහණ දන්දෙනිය මහතා<br>පියසීලී ජයවර්ධන මහත්මිය<br>එස්. දිසානායක මහත්මිය<br>ප්‍රේමසිරි සුබසිංහ මහතා<br>එච්.පී. සුසිල් සිරිසේන මහතා<br>ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා<br>විමලා රණසිංහ මහත්මිය<br>නයන තිලක් රත්නායක මහතා<br>ජේ. සෙනෙවිරත්න මහතා<br>යූ.ජේ.ජී. මාග්‍රට් මහත්මිය<br>එන්.එම්. විමලසේන මහතා<br>සුජාතා ඔබේසේකර මහත්මිය |

| | | |
|---|---|---|
| ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර) | - | එස්.ඒ. පේමසිරි සුබසිංහ මහතා<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි |
| | - | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>ව්‍යාපෘති නිලධාරි |
| | - | කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ව්‍යාපෘති නිලධාරි |
| | - | ඩබ්ලිව්.පී. මංගල ගුණරත්න මහතා<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | එම්.ජී. මුණසිංහ මහතා<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | පී.ටී.එම්. රත්නායක මිය<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| | - | පී.ඒ.ඩී. රුවනි සිසිජා කල්දේරා මිය<br>සහකාර ව්‍යාපෘති නිලධාරි |
| ලේඛක මණ්ඩලය (බාහිර) | | |
| | - | එච්.පී. සුසිල් සිරිසේන මහතා<br>කථිකාචාර්ය |
| | - | එස්.ඕ ප්‍රනාන්දු මහතා<br>අධ්‍යක්ෂ (විශ්‍රාමික) |
| | - | ආර්.පී. ධර්මපාල මහතා<br>ගුරු සේවය |
| | - | ඩබ්ලිව්.එම්.එන්. බණ්ඩාර මහතා<br>ගුරු සේවය |
| | - | ඩබ්ලිව්.ආර්.ඒ.එස්.එල්. රණසිංහ මහත්මිය<br>ගුරු උපදේශිකා |
| | - | එම්.එස්. විමලසූරිය මහතා<br>ගුරු උපදේශක |
| | - | අරුණ ඉන්දික වේරගල මහතා<br>ගුරු සේවය |

භාෂා සංස්කරණය - ජාතික අධ්‍යාපන ආයතනය

පරිගණක වචන සැකසුම - ඉමේෂා කුමාරි මෙය

වෙබ් අඩවිය - www.nie.lk

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | ii |
| සංඥාපනය | iii |
| හැඳින්වීම | viii |
| මළගිය ඇත්තෝ නවකතාව | 1 |
| පුරාතන ගද්‍ය | 6 |
| ගිරා සන්දේශය | 16 |
| නූතන පද්‍ය | 19 |
| කෙටිකතා | 34 |
| භාෂාව හා ව්‍යාකරණය | 42 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම | 49 |
| පාසල පාදක කරගත් ඇගයීම | 51 |

## 1.0 හැඳින්වීම

නිපුණතා පාදක කරගත් අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂය නිර්දේශානුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත. මෙහි ඇතුළත් තොරතුරු උසස් පෙළ සිංහල විෂය උගන්වනු ලබන ගුරු මහත්ම මහත්මීන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම පහසු කරවනු ඇත. 13 වන ශ්‍රේණියට අදාළ නිපුණතා 06කි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ද දක්වා ඇත. සියලු ම නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් ඉදිරිපත් කර ඇත. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගැනීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පහත සඳහන් ශීර්ෂ යටතේ සකස් කර ඇත.

1.0 නිපුණතා

විෂය නිර්දේශයේ 13 වන ශ්‍රේණිය සඳහා අදාළ වන එක් එක් නිපුණතාව මේ යටතේ දක්වා ඇත.

2.0 නිපුණතා මට්ටම්

පූර්වෝක්ත නිපුණතාව කරා ළඟා විය හැකි නිපුණතා මට්ටම් මෙයට ඇතුළත් වෙයි..

3.0 කාලච්ඡේද එකතුව

ඉහත දැක්වූ නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී යෝජිත කාලච්ඡේද සංඛ්‍යාව දක්වා ඇත. එය සුදුසු පරිදි වෙනස් කර ගැනීමේ අවකාශ පවතී.

4.0 ඉගෙනුම්ඵල

එක් එක් නිපුණතාවට අදාළ ව සිංහල විෂය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අවසානයේ අපේක්ෂිත සිසු චර්යා වෙනස්කම් මේ යටතේ ඉදිරිපත් කර ඇත. අදාළ ක්‍රියාකාරකම් තක්සේරුකරණ නිර්ණායක වශයෙන් ද භාවිත කළ හැකි ය.

5.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්

එක් එක් නිපුණතා සාක්ෂාත් කරගැනීමට උපකාරීවන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා නිපුණතා මට්ටම්වලට අදාළ විෂය අන්තර්ගතය කෙටියෙන් මේ යටතේ දක්වා ඇත. විෂය අන්තර්ගතය පිළිබඳ කරුණු අවසානයේ අදාළ නිපුණතා මට්ටම් වෙත සිසුන් ළඟාකර ගැනීමට උපකාරී වන ක්‍රියාකාරකම් කීපයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාකාරකම්වලට අමතර ව ගුරු මහත්ම මහත්මීන්ට උචිත පරිදි නිර්මාණාත්මක නව ක්‍රියාකාරකම් සකස් කර ගැනීමේ අවකාශය ද ඇත.

6.0 පාසල පදනම් කරගත් තක්සේරුකරණය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමක් ඉදිරිපත් කර ඇත. සිසු ගවේෂණය මගින් කරුණු රැස්කර ගැනීමට පෙලඹුමක් ඇතිවන පරිදි එම ඇගයුම් සැලසුම් කර තිබේ. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති ඇගයීම්, පාසල් පාදක ඇගයීම් සඳහා යොදාගත යුතු ය. වාරයකට ඇගයීම් අවස්ථා 03 බැගින් වාර 2ක් සඳහා ඇගයීම් 06ක් ඉදිරිපත් කර ඇත.

**මළගිය ඇත්තෝ**

**නිපුණතාව 1.0** ඃ නවකතා පරිශීලනයෙන් ලබන ජීවිතාවබෝධය එදිනෙදා ජීවිතය සඳහා ප්‍රායෝගික ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** ඃ 1.1 මළගිය ඇත්තෝ නවකතාවේ දෘෂ්ටිය හා චරිත නිරූපණය විචාරාත්මක ව දකියි.
1.2 මළගිය ඇත්තෝ නවකතාවේ සුවිශේෂතා හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 48යි.

**ඉගෙනුම් ඵල**

- 'මළගිය ඇත්තෝ' නවකතාවේ ජීවන දෘෂ්ටිය ඉදිරිපත් කරයි.
- නවකතාවේ නිරූපිත චරිතවල ස්වභාවය විග්‍රහ කරයි.
- චරිත නිරූපණයේ දී කතුවරයා යොදාගත් ශිල්පීය ක්‍රම ප්‍රකාශ කරයි.
- නවකතාවේ අවස්ථා නිරූපණ උපුටා දක්වයි.
- නවකතාවේ විචිත්‍රත්වය සඳහා පරිසර වර්ණනා යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරයි.
- 'මළගිය ඇත්තෝ' නවකතාවේ නිරූපිත ජපන් සංස්කෘතියේ තොරතුරු විස්තර කරයි.
- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නවකතාවෙන් පිළිබිඹු කෙරෙන මානව සබඳතාවල ස්වභාවය පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට පාඨවල අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**විෂය අන්තර්ගතය**

- 'මළගිය ඇත්තෝ' නවකතාවේ ජීවන දෘෂ්ටිය
- මළගිය ඇත්තෝ නවකතාවේ චරිත නිරූපණය හා ශිල්පීය ක්‍රම
- චරිත නිරූපණයේ දී යොදාගත් ශිල්පීය ක්‍රම
- නවකතාවේ නිරූපිත අවස්ථා හා සිද්ධි
- නවකතාවේ අවස්ථානුකූල ව යෙදී ඇති පරිසර වර්ණනා
- ජපන් සංස්කෘතියේ තොරතුරු
- යොදාගෙන ඇති භාෂාවේ නිර්මාණාත්මක ලක්ෂණ
- නවකතාවෙන් පිළිබිඹු වන මානව සබඳතා
- නිර්දිෂ්ඨ පාඨවල අවස්ථා සම්බන්ධය හඳුනා ගැනීම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 01**

**මළගිය ඇත්තෝ නවකතාවේ ජීවන දෘෂ්ටිය හඳුනා ගනිමු.**

**පියවර 01**

මළගිය ඇත්තෝ නවකතාවේ ජීවන දෘෂ්ටිය හඳුනා ගැනීම සඳහා ශාස්ත්‍රීය සාකච්ඡා මණ්ඩපයක් පැවැත්වීමට සිසුන් සූදානම් කරවන්න. මේ සඳහා පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරන්න.

- ශාස්ත්‍රීය සාකච්ඡා මණ්ඩපයක් මෙහෙයවීම සඳහා සුදුසු අයෙකු පන්තියෙන් තෝරාගන්න.
- ශාස්ත්‍රීය සාකච්ඡා මණ්ඩපය සඳහා සිසුන් හතර දෙනෙකු තෝරාගන්න.
- සංවාදයක ස්වරූපයෙන් ශාස්ත්‍රීය සාකච්ඡා මණ්ඩපය පවත්වන්න.
- ප්‍රතිවිරුද්ධ මතවාද සමග ගැටෙන පරිදි සාකච්ඡාව සංවිධානය කරන්න.

**පියවර 02**

ශාස්ත්‍රීය සාකච්ඡා මණ්ඩපය සඳහා තෝරාගත් ශිෂ්‍යයන් සිවුදෙනාට පහත සඳහන් මාතෘකා අනුව කරුණු ගොනු කර ගැනීමට උපදෙස් දෙන්න.

- ජීවන දෘෂ්ටිය යනු කුමක් ද?
- නවකතාවකින් ජීවන දෘෂ්ටිය හෙළිවන ආකාරය
- මළගිය ඇත්තෝ නවකතාවෙන් හෙළිවන ජීවන දෘෂ්ටිය
- ජීවන දෘෂ්ටිය ඉදිරිපත්වන අවස්ථා හා සිද්ධි ඉදිරිපත් කිරීම

ශාස්ත්‍රීය සාකච්ඡාව අවසන් වූ පසු සමාලෝචනයක් ඉදිරිපත් කරන්න.

**ක්‍රියාකාරකම 02**

**මළගිය ඇත්තෝ නවකතාවේ චරිත නිරූපණය හඳුනා ගනිමු.**

**පියවර 01**

සිසුන් ලවා මළගිය ඇත්තෝ නවකතාවේ චරිත නිරූපණය කරවමින් චරිත නිරූපණය හඳුනා ගැනීම සඳහා කටයුතු පිළියෙල කරන්න.

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක් කණ්ඩායමකට දෙවෙන්දොරා සංගේ චරිතයත් අනෙක් කණ්ඩායමට නොරිකෝ සංගේ චරිතයත් නිරූපණය කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.
- සිසුන්ට පෙර පුහුණුව සඳහා අවස්ථාව ලබාදෙන්න.
- පුහුණුවෙන් පසු ඒ ඒ චරිතාරෝපණයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නොරිකෝ සංගේ චරිතයේ විවිධ අවස්ථා නිරූපණය කරන කණ්ඩායමේ සිසුන් නොරිකෝ සංගේ චරිත ලක්ෂණ ද දෙවෙන්දොරා සංගේ චරිතයේ විවිධ අවස්ථා නිරූපණය කරන කණ්ඩායමේ සිසුන් දෙවෙන්දොරා සංගේ චරිත ලක්ෂණ ද ලේඛනගත කරන්නට උපදෙස් දෙන්න.
- චරිත නිරූපණය සඳහා කතුවරයා යොදා ඇති ශිල්පීය ක්‍රම පිළිබඳ පැහැදිලි කරමින් සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 03**

**මළගිය ඇත්තෝ නවකතාවේ චරිත නිරූපණය සඳහා භාවිත කළ ශිල්පීය ක්‍රම අධ්‍යයනය කරමු.**
නවකතාව කියවා ශිල්පීය ක්‍රම ගවේෂණය කිරීමට සිසුන් යොමු කරවන්න. පහත දැක්වෙන ශීර්ෂ යටතේ කරුණු පෙළගස්වන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

- චරිත එකිනෙක ගැටෙන්නට සැලැස්වීම
- චරිත අභ්‍යන්තර ගැටුම්
- ආත්ම භාෂණ ඉදිරිපත් කිරීම
- දාර්ශනික සිතිවිලි ඉදිරිපත් කිරීම
- අතීතාවර්ජන
- චරිත නිරූපණය සඳහා පරිසරය හා සංකේත භාවිතය
- ජීවන වෘත්තියේ විවිධත්වය මත චරිතවල ස්වභාවය වෙනස්වන ආකාරය

**ක්‍රියාකාරකම 04**

**මළගිය ඇත්තෝ නවකතාවේ අවස්ථා සහ සිද්ධි නිරූපණය හඳුනා ගනිමු.**

පියවර 01

මළගිය ඇත්තෝ නවකතාවේ අවස්ථා සහ සිද්ධි නිරූපණය හඳුනා ගැනීම සඳහා අවස්ථානුකූල ව සිසුන් සාකච්ඡාමය ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. ඒ සඳහා මෙවැනි අවස්ථා හා සිද්ධි පදනම් කරගන්න.

- දෙවෙන්දොරා සං ජපානයට පැමිණි අවස්ථාව
- දෙවෙන්දොරා සං ජපාන සමාජ රටාවට හුරුවීමට උත්සාහ දරන අවස්ථාව
- නොරිකෝ සං සමග දොවෙන්දොරා සං කබුකි බලන්නට ගිය අවස්ථාව
- දෙවෙන්දොරා සං නොරිකො සංගේ පියා හමුවීමේ අවස්ථාව
- දෙවෙන්දොරා සං කියෝතෝ දුම්රියපොළට ඇරලූ අවස්ථාව
- නොරිකො සහ දෙවෙන්දොරා සං කෝපි අවන්හල වෙත යෑම සම්බන්ධ සිදුවීම්
- දෙවෙන්දොරා සං නැවත නොරිකෝ සං මුණ ගැසීමේ අවස්ථාව
- දෙවෙන්දොරා සං සහ නොරිකෝ සං ග්‍රීෂ්ම ඍතු රැඟුමක් නරඹා එන අතර දෙදෙනා අතර ඇති වන සංවාදය
- දෙවෙන්දොරා සං ලංකාවට පැමිණීම හා පුවත්පතක සේවයට බැඳීම සම්බන්ධ සිදුවීම

**ක්‍රියාකාරකම 05**

**මළගිය ඇත්තෝ නවකතාවේ නිරූපිත පරිසර වර්ණනා පිළිබඳ විචිත්‍රතාව වටහා ගනිමු.**
මළගිය ඇත්තෝ නවකතාවේ නිරූපිත පරිසරයේ විචිත්‍රතාව කියැවෙන කොටස් තෝරාගෙන සිසුන් ලවා කියවන්නට සලස්වන්න. ඒ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් කරන්න.
පහත සඳහන් කොටස් නිදසුන් ලෙස දැක්විය හැකි ය.

- "ඒ රටට පැමිණි මට වහා ම හැඟුණේ බැලූ බැලූ අත විවිධ වර්ණයෙන් ඇස පිනවන වෙන රටක් මා දැක නැති බව ය".......
- "මා දවස් කීපයක් ම ගතකළේ, කුල්මත් වූ සිතකින් යුක්ත ව හුදෙක් වටා පිටාවේ මවා තබන ලද සෞන්දර්යය විඳ නිදැල්ලේ ඇවිදිමිනි" .....
- "මා ලන්ඩන් නුවර සිටිය දී" ....
- "තෝකියෝ කොයිතරම් අමුතු ද? එහි විශේෂ සුවඳක් තිබේ" ......... ආදි වශයෙන් ආරම්භ වන ඡේද

ක්‍රියාකාරකම 06

**ජපන් සංස්කෘතියේ ස්වභාවය වටහා ගනිමු.**

පියවර 01

සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.

පියවර 02

පන්තිය කණ්ඩායම් කළ පසු එක් එක් කණ්ඩායමට පහත දැක්වෙන මාතෘකා ලබාදෙන්න. මාතෘකාවලට අනුව කරුණු ගවේෂණය කර තොරතුරු රැස්කිරීමට අවස්ථාව ලබාදෙන්න.

- ජපානයේ ජීවත් වන විවිධ පුද්ගල චරිත
- ජපානයේ පරිසර ස්වභාවය
- ජපන් වැසියන්ගේ ජීවන රටාව
- ජපන් වැසියන්ගේ සිතුවිලිවල ස්වභාවය
- ජපන් වැසියන් පවත්වන සංස්කෘතික හා ආගමික උත්සව

පියවර 03

තොරතුරු රැස්කිරීම අවසන් වූ පසු එක් එක් කණ්ඩායමට පැවරුණු මාතෘකාවට සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදෙන්න.

පියවර 04

එක් එක් කණ්ඩායම් තොරතුරු ඉදිරිපත් කිරීම අවසන් කළ පසු පොදු සමාලෝචනයක් ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම 07

**මළගිය ඇත්තෝ නවකතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ සහ කථන ක්‍රමයේ විවිධතා හඳුනා ගනිමු.**

මළගිය ඇත්තෝ නවකතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ සහ කථන ක්‍රමයේ විවිධතා ගවේෂණය කිරීම සඳහා පැවරුමක් දෙන්න. මේ සඳහා පහත සඳහන් කරුණු පාදක කර ගන්න.

- භාවපූර්ණ කාව්‍යමය භාෂාව
- ලක්ෂ්‍යාර්ථවත් බව
- ධ්වනිපූර්ණ බව
- අලංකාරෝක්ති භාවිතය
- සංකේත භාවිතය
- ව්‍යවහාර භාෂා භාවිතය

**ක්‍රියාකාරකම 08**

**පියවර 1**

**මළගිය ඇත්තෝ නවකතාවෙන් නිරූපිත මානව සබඳතාවන්හි ස්වභාවය පැහැදිලි කරමු.**
පහත දැක්වෙන ශීර්ෂ යටතේ යෝග්‍ය පැවරුමක් ලබාදෙන්න.

- දෙවෙන්දරා සං සහ නොරිකෝ සං අතර පැවති සබඳතාව
- නොරිකෝ සං සහ නොරිකෝ සංගේ පියා අතර පැවති සබඳතාව
- දෙවෙන්දොරා සං සහ නොරිකෝ සංගේ පියා අතර වූ සබඳතාව
- හිදෙජි සං සහ නොරිකෝ සං අතර පැවති සබඳතාව
- හිදෙජි සං, දෙවෙන්දරා සං හා නොරිකෝ සං අතර පැවති සබඳතාව

**පියවර 2**

- පිළියෙල කළ පැවරුම් කිහිපයක් තෝරාගෙන ඇගයීමක් කරන්න.

**ක්‍රියාකාරකම 09**

**මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටා ගත් පාඨවල අවස්ථා සම්බන්ධය හඳුනා ගනිමු.**

**පියවර 1**

පහත දැක්වෙන නිදසුන් පිළිබඳ අවධානය යොමු කරන්න.
"ඔව් මං සැරයක් දැක්ක සාරා බායි නිළිය"
"දිනෙන් දින මගේ සිතේ වැඩුණු සංකාව පහවන හැඩක් නොපෙනුණි"
"මෙච්චරයි මට මේස් කුට්ටමක් තියෙන්නේ"
"මේ ලෝකයෙහි මට ඇත්තාවූ ඉතා ම වටිනා වස්තුව වන මගේ පියා හදිස්සියෙ මළා"

**පියවර 2**

පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් දෙකකට වෙන්කරන්න. පියවර 1හි සඳහන් පරිදි නව කතාවේ විවිධ ස්ථානවලින් උද්ධෘත සටහන් කර ගැනීමට උපදෙස් ලබාදෙන්න. ප්‍රතිවිරුද්ධ කණ්ඩායමට උද්ධෘත ඉදිරිපත් කර එම උද්ධෘතවල අවස්ථා සම්බන්ධය වාචික ව ලබාගන්න උපදෙස් දෙන්න. මෙය තරගයක ආකාරයට පැවැත්විය හැකි ය.

## පුරාතන ගද්‍ය සාහිත්‍යය

**නිපුණතාව 2.0** : පුරාතන ගද්‍ය සාහිත්‍යය ඇසුරු කරමින් තම රසඥතාව පුළුල් කර ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 සද්ධර්මරත්නාවලියේ අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි.
2.2 පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි.
2.3 සද්ධර්මාලංකාරය කෘතියේ අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 48යි.

**ඉගෙනුම් ඵල**

- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විශේෂතා හඳුනාගෙන කතා වස්තු කියවීමට පෙලඹෙයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය සාහිත්‍ය කොටස් අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යකරුවා පුද්ගල චරිත නිරූපණය කර ඇති අයුරු විමසා බලයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණවල අවස්ථා, සිද්ධි හා පරිසර නිරූපණය හඳුනාගෙන විමර්ශනය කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍යකරුවාගේ ජීවන දෘෂ්ටිය හඳුනා ගනියි.
- නිර්දිෂ්ට පාඨවල අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**විෂය අන්තර්ගතය**

- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විශේෂතා
- දුරවබෝධ වචනවල අර්ථ දැක්වීම
- පුද්ගල චරිත නිරූපණය
- අවස්ථා, සිද්ධි හා පරිසර නිරූපණ
- ජීවන දෘෂ්ටිය

**ක්‍රියාකාරකම 1**

- **පුරාතන ගද්‍ය සාහිත්‍යයේ දැකිය හැකි විශේෂතා අගය කරමු.**

පියවර 1

- නිර්දිෂ්ට ජාතක කතාවක් හෝ කතා වස්තුවක් හොඳින් කියවීමට සලස්වන්න.

පියවර 2

- තෝරාගත් කණ්ඩායම් කිහිපයක් හෝ එක් කණ්ඩායමක් ලෙසින් මුළු පන්තියට හෝ පහත සඳහන් විශේෂතා සඳහන් කොට ඒ පිළිබඳ කරුණු සොයා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

i. කතා රසය ඉස්මතුවන අවස්ථා
ii. සාරධර්ම හා සර්වකාලීන උපදේශ
iii. යොදාගත් බස හා රචනාශෛලිය
iv. උචිත අවස්ථා, සිද්ධි හා පරිසර නිරූපණය
v. පුද්ගල චරිත විනිවිද දැකීමේ අවස්ථා
vi. ජීවන දෘෂ්ටිය

පියවර 3

- පියවර 2හි මාතෘකා අනුව වෙන් වෙන් ව කණ්ඩායම් හෝ පන්තියේ මුළු සිසුන් විසින් ගවේෂණය කරනු ලැබූ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

පියවර 4

- ඉදිරිපත් කරන ලද තොරතුරු හා නිදසුන් පුළුල් ව සාකච්ඡා කොට සමාලෝචනය කරන්න.

**ක්‍රියාකාරකම 2**

**වචනවල අරුත් පැහැදිලි කර ගනිමු.**

පියවර 1

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. ඒ ඒ කණ්ඩායම් සඳහා නිර්දිෂ්ට පුරාතන ගද්‍ය සංග්‍රහයේ එන ඉගෙන ගත් කතා වස්තුවක් ලබා දෙන්න. (එක් කතා වස්තුවක් කණ්ඩායම් දෙකකට ලබාදිය හැකි ය.)

පියවර 2

- එක් එක් කණ්ඩායමට ලැබුණු කතා වස්තුවල ඇති දුරවබෝධ වචන අකාරාදි ක්‍රමයට ලැයිස්තුගත කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3

- දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කිරීම් සහිත ව පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

පියවර 4

- සොයාගත් දුරවබෝධ වචනාර්ථ පැහැදිලි කිරීම් ගොනු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර 5

- සිසු ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගෙන සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 3**

**අවස්ථා සම්බන්ධය පැහැදිලි කර ගනිමු.**

පියවර 1

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.

පියවර 2

- එක් එක් කණ්ඩායමට කතාවස්තු කියවීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 3

- ඒවායින් අවස්ථා සම්බන්ධය දැක්වීම සඳහා වැදගත් පාඨ තෝරාගැනීමට සහ පිළිතුරු සූදානම් කර ගැනීමට කණ්ඩායම් දෙකට ම උපදෙස් දෙන්න.

පියවර 4

- කණ්ඩායම් දෙක අතර අවස්ථා සම්බන්ධය පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු ඉදිරිපත් කිරිමට අවස්ථාව සලස්වන්න. මෙය තරගයක ආකාරයෙන් පැවැත්විය හැකි ය.

**ක්‍රියාකාරකම 4**

- **මච්ඡරිය කෝසිය සිටාණන්ගේ කතා වස්තුවෙහි එන ප්‍රධාන චරිත පිළිබඳ තොරතුරු රැස් කරමු.**

**පියවර 1**

- මච්ඡරිය කෝසිය සිටාණන්ගේ කතා වස්තුව කියවීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- කතා වස්තුවෙහි එන ප්‍රධාන චරිතවල ලක්ෂණ ලැයිස්තු ගත කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 3**

- එම තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 4**

- ඒ ඒ චරිත හැඩ ගැන්වීමේලා මූලික වූ මානසික ස්වභාවය විවරණය කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
  (අනෙක් කතාවල එන චරිත හඳුනා ගැනීම සඳහා ද මෙම ක්‍රියාකාරකම යොදා ගත හැකි ය.)

**මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව**

**කතාවේ අරමුණ**

මසුරුකම නැමැති මිනිස් දුබලතාව දෙස සානුකම්පිත ව බැලීම

**කතාවේ අන්තර්ගතය**

- සිටාණන්ට කබලු කැමේ ආශාවක් ඇතිවීම. ධනය වැය වෙන බැවින් කිසිවෙකුට නොකියා එය සඟවාගෙන දුක සේ සිටීම
- ඒ නිසා ඔහු කායික හා මානසික පීඩාවට පත්වීම
- බිරිඳගේ විමසීම නිසා ඉතා අපහසුවෙන් සිය ආශාව පැවසීම
- බිරිඳගේ අදහස් හා සිටාණන්ගේ අදහස් අතර ඇති වන ගැටුමෙන් සිටාණන්ගේ මසුරුකම ප්‍රකටවීම
- එකඟතාවකට පැමිණ කබලු පිසීම
- මුගලන් තෙරුන් හමුවීම
- බුදුරදුන් හමුවීම
- දහම් අසා සෝවාන් වීම

**චරිත නිරූපණය**

**සිටුවරයාගේ චරිතය**

- මසුරුකම නිසා ආශාව සිතේ සඟවාගෙන කාය චිත්ත පීඩාවට පත් වූ චරිතයකි.
- ඔහු මසුරුකම නිසා ම පටු දෘෂ්ටියකින් බලා තීරණ ගන්නා අයෙකි.
- සිද්ධි හා අවස්ථා තුළින් සිටාණන්ගේ මසුරුකම මැනවින් නිරූපණය වේ.
- මෙම චරිතය සජීවී ලෙස නිරූපණය කර ඇත.

**සිටුවරියගේ චරිතය**

- නොපටු දෘෂ්ටියක් ඇති නොමසුරු සිතක් ඇති චරිතයකි.
- සිටාණන්ගේ චරිත ලක්ෂණවලට ප්‍රතිවිරුද්ධ චරිත ලක්ෂණ ඇත.
- එබැවින් සිටු චරිතය සමග ගැටෙයි. එහි දී සිටුවරයාගේ මසුරුකම ඉස්මතුවේ.
- එහෙත් ඇය සිය සැමියා කෙරෙහි අනුකම්පාවෙන් බලන්නී ය.

**අවස්ථා නිරූපණය**

- සිටුවරයා ආශාව සඟවාගෙන සිතින් දුක් විඳින අවස්ථාව
- සිටුදේවිය සැමියාගේ තතු විමසන අවස්ථාව
- කබලු පිසීමට එකඟවී ඒ පිළිබඳ සිටුදේවියගේ අදහස් සමග ගැටෙන අවස්ථාව
- මුගලන් හිමි සිටු මැදුරට පිඬුසිඟා වැඩමකළ අවස්ථාවේ සිටුවරයාගේ හැසිරීම.
- මුගලන් හිමියන් හමුවේ මසුරු මළ දුරු වූ අවස්ථාව

**භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය**

- අවස්ථා හා චරිත නිරූපණයේ දී උපයෝගී කරගත් භාෂා ශෛලියේ විශේෂතා
- උචිත උපමා භාවිතය
- ජනවහර උපයෝගී කර ගැනීම
- අවස්ථාවට උචිත රසභාවයන් දැනවීමට සමත් භාෂා ව්‍යවහාරයක් යොදා ගැනීම
- උපහාසය හා සානුකම්පික දෘෂ්ටිය ප්‍රකට වන පරිදි භාෂාව උපයෝගී කර ගැනීම
- සංවාදශීලී භාෂාව මගින් සජීවී අවස්ථා නිරූපණය

**සම්බුලා ජාතකය**

**කතාවේ අරමුණ**

- ස්වාමියා ස්වකීය කුලදෙවියා ලෙස සලකා පතිදම් සුරකින ස්ත්‍රිය සියලු බාධා ජයගනිමින් සැපසේ වාසය කරයි. යන මතය සනාථ කිරීම
- කාන්තාවන්ගේ යහගුණ හුවා දැක්වීම
- විවිධ අවස්ථාවල දී පුද්ගල චෛතසිකය ක්‍රියාත්මක වන ආකාරය දැක්වීම
- සාම්ප්‍රදායික බමුණු මතවාද බිඳ හෙලීම

**කතාවේ අන්තර්ගතය**
**වර්තමාන කතාව**

- කොසොල් රජුගේ අග මෙහෙසිය වූ මල්ලිකා දේවිය අරබයා දේශන කර ඇත.
- සම්බුලා ජාතකයේ වර්තමාන කතාව කුම්මාසපිණ්ඩ ජාතකයෙහි සවිස්තර ව සඳහන් වේ.

**අතීත කතාව**

- බරණැස් රජු සිය පුත් සොත්ථිසේන කුමරු යුවරජ තනතුරට පත්කිරීම
- සොත්ථිසේන කුමරු සම්බුලා කුමාරිකාව අග මෙහෙසිය කර ගැනීම
- සොත්ථිසේන යුවරජුට කුෂ්ට රෝගයක් වැලදීම
- සොත්ථිසේන යුවරජු කුෂ්ට රෝගය හේතුවෙන් සම්බුලා දේවිය ද සමග වනගත වීම
- වනය තුළ දී සම්බුලා දේවිය සිය ස්වාමියාට ඇප උපස්ථාන කිරීම
- වනය තුළ වසද්දී දානව රාක්ෂයෙක් තමන් සමග වසන්නැයි සම්බුලා දේවියගෙන් ඉල්ලා සිටීම
- සම්බුලා දේවිය තමන් මුහුණ පෑ ඛේදවාචකය දෙවියන්ට කීම
- සක්දෙවිඳු පැමිණ සම්බුලා දේවිය බේරා ගැනීම
- මෙම සිද්ධිය හේතුවෙන් සම්බුලා දේවියට සොත්ථිසේන රජු වසන ස්ථානයට යෑමට ප්‍රමාදවීම
- ප්‍රමාදය නිසා සිත් බිඳුණු සොත්ථිසේන රජු සම්බුලා දේවිය පැමිණෙද්දී සැඟවීම
- ස්වාමියා නුදුටු සම්බුලා දේවිය ස්වාමියා සොයා දෙන ලෙස කියමින් හඬා වැටීම
- දේවිය හඬා වැටීම නිසා රජු සැඟවුණු තැනින් එළියට පැමිණ ප්‍රමාදයට හේතු දේවියගෙන් විමසීම
- දේවිය කියූ හේතු නොපිළිගැනීම
- සොත්ථිසේන රජු තමා කී හේතු නොපිළිගත් නිසා සම්බුලා දේවිය සත්‍ය ක්‍රියාකොට එහි අනුහසින් සිසිල්පැන් කලයකින් රජු නැවූ පසු ඔහුගේ කුෂ්ට රෝගය සුවවීම
- බරණැස් නුවරට ගිය පසු සොත්ථිසේන රජු සම්බුලා දේවිය නොසලකා වෙනත් අන්තඃපුර ස්ත්‍රීන් සමග සතුටින් දිවි ගෙවීම
- මෙයින් ශෝකයට පත් සම්බුලාවගේ රූප ශොභාව පිරිහීම හා ඇගේ ශරීරය සුදුමැලිවීම
- සොත්ථිසේන රජුගේ පියා තම ලේලියගෙන් රූපශ්‍රිය පිරිහීමට හේතු විමසීම
- හේතුව ඇසූ සොත්ථිසේන රජුගේ පියා තම පුතු කැඳවා අවවාද දීම
- එවිට සොත්ථිසේන රජු තමා කළ වරදට සමාවී සතුටින් රාජ්‍යය කරමු'යි කියා ඇට ද රාජ්‍ය පාලනය පවරා සතුටින් රාජ්‍ය පාලනය කොට බොහෝ කාලයක් ජීවත් ව සිට මියයෑම

**චරිත නිරූපණය**

**සම්බුලා දේවියගේ චරිතය**

- පතිදම් සුරකින යහපත් කාන්තාවක් වීම
- සිය සැමියාට කුල දෙවියෙකු සේ සැලකීම
- විවිධ දුක්පීඩා විඳ ගනිමින් යහ ගුණයෙන් විසීම
- සංවේදී වීම
- සීලවන්තියක් ලෙස නිරූපණය වීම

**සොත්ථිසේන රජුගේ චරිතය**

- කළගුණ නොදත් ගුණමකු බව
- තම බිසව පිළිබඳ නිසි සැලකිල්ලක් නොදැක්වීම
- බිසව සම්බන්ධ ව වැරදි ආකල්ප දැරීම
- තමා කළ වැරදි පිළිගැනීමට නිහතමානීවීම
- ධනයෙන් බලයෙන් උඩඟු වන විටත්, රෝග පීඩාවලදීත් විෂමාකාර ව ක්‍රියාකිරීම

**අවස්ථා නිරූපණය**

- සම්බුලා දේවිය සොත්ථිසේන රජුට වනය තුළ දී උපස්ථාන කළ අවස්ථාව
- දානව රාක්ෂයා හමුවේ සම්බුලා දේවිය හැසිරෙන ආකාරය
- සිය සැමියාගේ ක්‍රියාකලාපය නිසා ශෝකයෙන් පීඩිත වූ සම්බුලා දේවියගේ හැසිරීම
- සම්බුලා දේවිය පලාපල ගෙනැවිත් දී සොත්ථිසේන රජුට උවටැන් කළ ආකාරය
- සම්බුලා දේවියගේ රූපශ්‍රීය වර්ණනා කළ ආකාරය

**භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය**

- වර්ණනාත්මක භාෂාව
- සජීවී සංවාදශීලී භාෂාව
- උචිත උපමා භාවිතය
- පාලි සංස්කෘත මිශ්‍ර භාෂා ශෛලිය
- අවශ්‍ය තැන කෙටි වාක්‍ය භාවිතය
- දීර්ඝ වාක්‍ය භාවිතය
- චිත්ත රූප මැවෙන ආකාරයේ භාෂා භාවිතය

දේව ධර්ම ජාතකය

කතාවේ අරමුණ

- උපායශීලී ව ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීම හේතුවෙන් අරමුණු සාධනය කළ හැකි බව
- අවස්ථාවෙන් ප්‍රයෝජන නොගෙන සාධාරණ තීන්දු ගෙන පැමිණි කරදරවලින් අත්මිදීම
- සහෝදර ප්‍රේමයෙන් හා දුර දිග දක්නා නුවණින් කටයුතු කිරීම
- බුද්ධිමත්කම හේතුවෙන් ඕනෑ ම උපද්‍රවයකින් මිදිය හැකිවීම

කතාවේ අන්තර්ගතය
වර්තමාන කතාව

- එක්තරා බහුභාණ්ඩික භික්ෂුවක් අරබයා
- බහු භාණ්ඩික තෙරණුවන් ලැජ්ජා හැර සිවුවණක් පිරිස මැද අඳනය පමණක් ඇඳ සිටීම

අතීත කතාව

- බෝසතුන් මහිංසාස නමින් බ්‍රහ්මදත්ත රජුගේ අගමෙහෙසුන් කුස පිළිබඳ ගැනීම
- චන්ද්‍ර කුමාරයා බිහිකිරීම
- බඹදත් රජුගේ දෙවැනි බිසව සූර්ය කුමරුන් බිහි කිරීම
- දෙවැනි බිසව විසින් සිය පුතු උපන් දිනයේ රජුගෙන් වරයක් ලෙස සූර්ය කුමරුන් වෙනුවෙන් බරණැස් රාජ්‍යයේ රාජ්‍යත්වය ලබාදෙන ලෙස ඉල්ලීම
- රජු විසින් ඒ බව කලින් බිසවගේ පුතුන් දෙදෙනාට දන්වා රජ ගෙදරින් පිට ව වනයට යැවීම හා ඊට සූර්ය කුමරු ද කැටුව යාම
- වනයේ දී දිය රකුසෙකුට සූර්ය හා චන්ද්‍ර කුමරුන් හසුවීම දේව ධර්මය නොදත් බැවින් ඔවුන්ට මිදී ඒමට නොහැකිවීම
- මහිංසාස කුමරු අවසානයේ සිය සොහොයුරන් සොයා යෑම
- දේව ධර්මය කියාදීම හා රකුසාගේ ඉල්ලීම මත විසඳුම් ලබා දී දෙබෑයන් මුදවා ගැනීම
- මහිංසාස කුමරු රජ බවට පත්වීම චන්ද්‍ර කුමරු යුව රජ වීම, සූර්ය කුමරු සෙනෙවි තනතුරට පත්කිරීම, දිය රකුසාට රාජ්‍යයේ දේවාලයක් කරදීම

චරිත නිරූපණය
බඹදත් රජුගේ චරිතය

- බරණැස් නුවර අගරජු ය
- සිය අගමෙහෙසියට ලැබුණු මහිංසාස හා චන්ද්‍ර නමින් පුතුන් දෙදෙනෙකුගේ පියෙකු ලෙසින් සිය බිසවට හා පුතුන්ට සෙනෙහස දැක්වීම
- සිය පළමු බිසව කාලක්‍රියා කළෙන් රජුට දාව දෙවැනි බිසවට සූර්ය කුමරුන් ලැබීම
- දෙවැනි බිසවගේ දරු ප්‍රසූතියෙන් පසු ව ඉල්ලූ වරයට එකඟ නොවීම, නිසා සාධාරණ තීරණ ගැනීම
- සිය පළමු බිසවගෙන් ලද පුතුන් වනගත කිරීමෙන් දුර දක්නා නුවණින් ස්ථානෝචිත ව කටයුතු කිරීම

**මහිංසාස කුමරුගේ චරිතය**

- සොහොයුරු ප්‍රේමයෙන් කටයුතු කිරීම
- බුද්ධිමත් ව, දූරදර්ශී ව කටයුතු කිරීම
- ස්ථානෝචිත ප්‍රඥාවෙන් තීරණගෙන ක්‍රියා කිරීම

**චන්ද්‍ර හා සූර්ය කුමාරවරුන්ගේ චරිතය**

- වැඩිමහලු සොහොයුරු මහිංසාසගේ අණසකට කීකරුවීම
- සහෝදර ප්‍රේමයෙන් යුක්ත ව කටයුතු කිරීම

**අවස්ථා නිරූපණය**

- වර්තමාන කතාවේ බහු භාණ්ඩික භික්ෂුව බුදුන් අභිමුඛ ව සිවුරු නොමැති ව අඳනය පමණක් ඇති ව සිටීම
- අතීත කතාවේ කුමාරවරුන් තිදෙනා පියාණන් නැමද වනගත වන අවස්ථාව
- දිය රකුසා විසින් චන්ද්‍ර, සූර්ය කුමරුන් සඟවා ගන්නා අවස්ථාව
- දියට නොබසින මහිංසාස කුමරුන්ට, දිය රකුසා දියබී, නෙළුම් අල කා නෙළුම් මල් පැළඳ යන ලෙසට කී ආයාචනය වැනි අවස්ථා
- මහිංසාස කුමරු දිය රකුසාට දහම් දෙසන අවස්ථාව
- මහිංසාස කුමරු සිය රාජ්‍යයේ රජු වී සිය සොහොයුරන්ට නිලතල ලබාදෙන අවස්ථාව

**භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය**

- සංවාදශීලී දෙබස් යොදා ගැනීම
- පාලි හා සංස්කෘත මිශ්‍ර භාෂාව යෙදීම
- කෙටි වාක්‍ය යෙදීම
- දිගු වාක්‍ය භාවිතය
- සංකල්ප රූප මැවෙන පරිදි භාෂාව යොදා ගැනිම

සද්ධර්මාලංකාරය

ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුව

කතාවේ අරමුණ

සතුරාට වුව මෛත්‍රී කිරීම අගය කොට සැලකිම
සොරකුට වුව යමක් අවබෝධ කිරීමෙන් ඔහු යහමග යැවීමට හැකිවීම

කතාවේ අන්තර්ගතය

ආරඤ්ඤක අභය තෙරණුවන් හා හරන්තික නම් සිවුරු සොරකම් කළ අයෙකු පිළිබඳ තොරතුරු කතාවට ඇතුළත් වේ.

- ආරඤ්ඤක අභය ස්ථවිර වසර 12ක් වනාන්තරයේ භාවනානුයෝගී ව වැඩවිසීම
- එක් උපාසකයෙකු ඒ කාලය තුළ දී සිව්පසයෙන් සංග්‍රහ කිරීම
- උපාසකයා පුදකළ සිවුරු හරන්තික නම් සොරෙකු විසින් සොරකම් කිරීම
- උපාසකයා විසින් මග රැක හරන්තික නම් සොරා අල්ලා සොහොනක මළ කඳක සමග ගැට ගසා තැබීම
- එම සොරා මළකඳ සමග ගෙයින් ගෙට යාම
- අභය මහතෙරණුවන් විසින් හරන්තික සොරාට පිහිටවී මහණකම ලබා දී උපසම්පදා කරවීම

චරිත නිරූපණය

- ආරඤ්ඤක අභය මහ තෙරණුන් උපාසකයා හා හරන්තික නම් සොරා මෙහි එන ප්‍රධාන චරිත තුනයි

ආරඤ්ඤක අභය මහ තෙරණුවන්ගේ චරිතය

- සුසිල්වත් ව අරණ්‍යක භාවනානුයෝගී ව වැඩ සිටින බව
- අල්පේච්ඡ දිවිපෙවෙතක්
- තමාට පූජා ලෙස ලැබුණු සිවුරු සොරකම් කළ හරන්තික සමග උරණ නොවීම
- තමන් වහන්සේගේ ඉරුණු, පරණ සිවුරු ම පරිහරණය කිරීම
- හරන්තික සොරා කෙරෙහි ද මෛත්‍රී කිරීම හා හෙතෙම මහණකොට උපසම්පදා කිරීමට තරම් කාරුණික වීම
- හරන්තික පිළිබඳ තොරතුරු සොයා ගත් උපාසකයාට කරුණු අවබෝධ කරදීම

හරන්තික නම් සොරාගේ චරිතය

- සිවුරු පිරිකර වුවත් සොරකම් කර ජීවත්වීම පුරුද්දක් කර ගැනීම
- උපායශීලී නොවීම
- මහණ උපසම්පදාව ලැබීමට තරම් වාසනාවන්තවීම

උපාසකගේ චරිතය

- භික්ෂූන්ට සිව්පසයෙන් සංග්‍රහ කරන්නෙකු වීම
- භික්ෂූන් වහන්සේලා කෙරෙහි උනන්දුවෙන් සොයා බලා කටයුතු කරන බව
- භික්ෂූන්ට අවනත බව

**අවස්ථා නිරූපණය**

- උපාසකයා විසින් මග රැක සිට සිවුරු සොරකම් කළ හරන්තික නම් සොරා සමග ඇතිවන සංවාද හා ඔහු සොහොනකට ගෙන ගොස් මළ කඳක් හා බැඳ තැබීම
- මළකඳ බැඳගත් සිරුර සහිත ව නිවැසියන් අතරට යන හරන්තික සොරාට බියේ ගම්වැසියන් හා සිය බිරිඳ පළා යෑම
- ඔවුන් සමග ඇතිවන සංවාද
- ආරක්ෂක අභය මහ රහතුන් හා හරන්තික අතර සිදුවන සංවාද

**භාෂා ලක්ෂණ හා රචනා ශෛලිය**

- සංස්කෘත තත්සම ශබ්ද සහිත භාෂා ලක්ෂණ
- සංවාද ඇතුළත් ගෞරවාර්ථ ප්‍රත්‍ය සහිත වැකි අඩංගු පණ්ඩිත ප්‍රිය ව්‍යක්ත භාෂා රටාවක් යොදා ගැනීම
- අර්ථකථන හා ධර්මෝපදේශ සහිත දෙබස්
- ශ්‍රැති ගෝචර, සංවාද ආශ්‍රිත සිද්ධි කථනය

ගිරා සන්දේශය

**නිපුණතාව 3.0** ඃ සිංහල සන්දේශ සාහිත්‍යය ඇසුරෙන් තම රසඥතාව විචාර හැකියාව හා නිර්මාණාත්මක කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** ඃ 3.1 ගිරා සන්දේශය පරිශීලනය කරමින් රසාස්වාදයේ යෙදෙයි.
3.2 ගිරා සන්දේශය පරිශීලනයෙන් ලබන අවබෝධය මගින් නිර්මාණකරණයට පෙලඹෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 48යි.

**ඉගෙනුම් ඵල**

- ගිරා සන්දේශයේ නියමිත කොටසෙහි ඇතුළත් විවිධ වර්ණනා හඳුනාගෙන ඒවා ලැයිස්තු ගත කරයි
- ගිරා සන්දේශ කාව්‍යයේ කවිවල අර්ථ පැහැදිලි කරයි
- ගිරා සන්දේශයේ වර්ණනාවල සුවිශේෂ ලක්ෂණ ප්‍රකාශ කරයි
- කවියාගේ ප්‍රතිභාව ඉස්මතු කෙරෙන වර්ණනා ඉදිරිපත් කරයි
- කාව්‍යාලංකාර උපයෝගී කරගෙන ඇති අයුරු විචාරය කරයි
- කාව්‍යමය භාෂාව අගය කරයි.
- ගිරා සන්දේශයෙන් හෙළිදරව් වන සමාජික තොරතුරු ලියා දක්වයි
- ගිරා සන්දේශයෙහි කවි ගායනා කරමින් රස විඳියි
- ගිරා සන්දේශයේ අභාසය ලබමින් කාව්‍ය නිර්මාණකරණයෙහි යෙදෙයි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**විෂය අන්තර්ගතය**

- වන වැනුම සිට අවසානය දක්වා වූ වර්ණනා
- ස්වභාව සෞන්දර්ය වර්ණනාවල සුවිශේෂ ලක්ෂණ
- භාෂාව හා කාව්‍යාලංකාර
- සාමාජික තොරතුරු
- සම්භාව්‍ය පද්‍ය කාව්‍ය ලක්ෂණ

**ක්‍රියාකාරකම** 1

**ගිරා සන්දේශය පරිශීලනය කරමින් රසාස්වාදය කරමු.**

**පියවර** 1

- සුදුසු පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න. ඉන් පසුව, ඒ ඒ කණ්ඩායම්වලට මෙම පැවරුම ඉදිරිපත් කරන්න.

1. වන වැනුම (167 - 194)
2. තොටගමු වැනුම (197 - 209)
3. තොටගමු විහාර වැනුම (210 - 231)
4. රහල් හිමි වැනුම (232 - 248)

i. කණ්ඩායමට ලැබී ඇති වර්ණනාවේ එන උපමා උපමේයයන් වෙන්කර ලියා දැක්වීමට අවස්ථාව ලබාදෙන්න. ඒවායේ ඇති උචිත අනුචිත බව සටහන් කරන්න.
i කණ්ඩායමට ලැබී ඇති වර්ණනාවේ එන හඳුනාගත් ශබ්දාලංකාර පැහැදිලි කරන්න.
iii. ලැබී ඇති වර්ණනාවේ ඇති නිර්මාණාත්මක ලක්ෂණ දක්වන්න.
iv. ලැබී ඇති වර්ණනාවේ ඔබ දකින ප්‍රබලතා හා දුබලතා මොනවාදැයි ලියන්න.

**පියවර 2**

- ඉහත පැවරුම පාදක කොටගෙන කණ්ඩායම් අතරේ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 3**

- සිසුන්ගෙන් පිළිතුරු ලබාගෙන ඒ පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 2 : ගායනය හා රසවින්දනයේ යෙදෙමු.**

පියවර 01 - සම්පත් පුද්ගලයෙකුගේ සහාය ලබාගෙන නිවැරදි ගායනය පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබාදෙන්න.

පියවර 02 - සිසුන් සමග සාකච්ඡා කරමින් ගායනයට උචිත පද්‍ය තෝරාගෙන ගායනයට යොමු කරවන්න.

පියවර 03 - ගායනයේ දී සාමූහික ව ද කණ්ඩායම් වශයෙන් ද තනි තනි (ඒකල) වශයෙන් ද ගායනය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 04 - සිසුන්ගේ ගායනයේ ප්‍රබලතා හා දුබලතා පෙන්වාදෙමින් සමාලෝචනයක යෙදෙන්න.

**පොදු උපදෙස්**

- ගායනයට සහාය පිණිස සංගීත භාණ්ඩ යොදා ගත හැකි ය.
- මෙය පාසල් පාදක ඇගයීමක් සේ සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.
- අවශ්‍ය පරිදි කණ්ඩායම් ක්‍රමය යොදා ගත හැකි ය.
- මේ සඳහා නිදහස් පරිසරයක් යොදා ගැනීමෙන් මෙම ක්‍රියාකාරකම ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ හැකි ය.

**ක්‍රියාකාරකම 3 : අපි කවි හදමු.**

| | | |
|---|---|---|
| පියවර 01 | - | සන්දේශ කාව්‍ය ආකෘතිය පිළිබඳ සාකච්ඡාවක යෙදෙමින් ඒ අනුව කවි නිර්මාණය කිරීම කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න. (කුඩා සංදේශ කාව්‍යයක්) |
| පියවර 02 | - | නිර්මාණකරණය සඳහා දූත වර්ණය, පුර වැනුම, මග වැනුම ආදී වර්ණනා පිළිබඳ ව තීරණයකට පැමිණීම හා පද්‍ය සංඛ්‍යාව තීරණය කරන්න. |
| පියවර 03 | - | පන්තිය කණ්ඩායම් 4කට බෙදීම හා එම වර්ණනා කණ්ඩායම් අතර බෙදා දීම හා අවශ්‍ය උපදෙස් ලබා කරන්න. |
| පියවර 04 | - | එම වර්ණනා අදාළ පිළිවෙළට එක්කොට සංදේශය සැකසීම හා ඒ ඒ කණ්ඩායම් ලවා ගායනා කරවන්න. |
| පියවර 05 | - | අඩුපාඩු සකස් කරමින් සමාලෝචනය කරන්න. |

**පොදු උපදෙස්**

- උචිත අරමුණක් තෝරා ගැනීමට සහායවන්න.
- වර්ණනා සඳහා පද්‍ය සංඛ්‍යාවක් තීරණය කරන්න.
- අදාළ පද්‍ය නිර්මාණය කරවන්න.
- ගැළපෙන නමක් යෙදීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා මැදිහත්වී අඩුපාඩු සකස් කරන්න.
- පිටකවරයක් සකස් කර සන්දේශය උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමාට පිළිගැන්වීමට කටයුතු යෙදවිය හැකි ය.

**නූතන පද්‍ය**

**නිපුණතාව 4.0** ඃ නූතන පද්‍ය සාහිත්‍යයේ විවිධතා කෙරෙහි අවධානය යොමු කරමින් නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳියි.

**නිපුණතා මට්ටම** ඃ 4.1 විචාර මූලධර්මවලට අනුව නූතන යුගයේ පද්‍ය රස විඳියි.
4.2 කාව්‍ය නිර්මාණකරණයෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 48 යි.

**ඉගෙනුම් ඵල**

- පද්‍ය නිර්මාණකරුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නූතන කාව්‍ය විචාර මූලධර්ම පැහැදිලි කරයි.
- කාව්‍ය රසාස්වාදයේ දී අවධානය යොමු කළ යුතු අංග හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කවි නිර්මාණය කරයි.
- නියමිත කාව්‍ය නිර්මාණවල තේමා විමසීමට ලක් කරයි. වෙනත් කාව්‍ය/ ගීත ආදි නිර්මාණ සමග සසඳයි.
- කාව්‍ය ආකෘතිවල විවිධතා හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නූතන කාව්‍ය නිර්මාණවල දක්නට ලැබෙන භාෂා ලක්ෂණ විග්‍රහ කරයි.
- නූතන කාව්‍ය නිර්මාණවල නව ප්‍රවණතා විමර්ශනය කරයි.
- විවිධ කාව්‍ය සම්ප්‍රදායන්ගෙන් ආභාසය ලබා ගත් බවට සාධක ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය විචාරය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**විෂය අන්තර්ගතය**

- පිතෘත්වය
- අම්මා
- දියණියනි
- දෙදෙනාම දියණියෝ
- මිතුරන් දෙදෙනා සහ පොරොව
- එතෙර ගිය පොඩි දුවට
- ගුරු පියාණනි
- වංකගිරියට මාරුවීම
- ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ
- සුරා සොඬ සැමි වලප
- වලව්වට වැසි ඇවිත්
- ලීස්තර වැට

**ක්‍රියාකාරකම 1**

**කාව්‍ය නිර්මාණකරුවන් පිළිබඳ තොරතුරු රැස් කරමු.**

අදාළ කාව්‍ය නිර්මාණවල රචකයන් පිළිබඳ තොරතුරු රැස් කරගෙන එන ලෙස සිසුන්ට කල් ඇතුව දැනුම් දෙන්න.

පියවර 01 - සිසුන් රැගෙන ආ තොරතුරු එක්රැස් කර ගන්න. ඒවා ගැන සාකච්ඡාකර අඩුපාඩු සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

පියවර 02 - කුඩා පොත් පිංචක් සකස් කිරීම සඳහා එක් කණ්ඩායමකට ලේඛකයන් 6 දෙනෙකු ඇතුළත් වන සේ සිසුන් කණ්ඩායම් කරන්න.

පියවර 03 - පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.

පියවර 04 - ඒ ඒ කණ්ඩායම් නායකයාට පන්තිය ඉදිරියේ තම පොත් පිංචෙහි අන්තර්ගතය පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න. සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 2**

**නූතන කාව්‍ය විචාර මූලධර්ම පැහැදිලි කර ගනිමු.**

පියවර 01 - නූතන කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ කෙටි දේශනයක් සූදානම් කරන්න. දේශනයට පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුය

- කාව්‍යය යනු කුමක් ද?
- කාව්‍ය විචාර සිද්ධාන්ත යනු මොනවා ද?
- නව නළු රස මොනවා ද?
- රසවින්දනය යනු කුමක් ද?

පියවර 02 - විචාර මූලධර්ම පිළිබඳ පොත්පත් කියවීමට සිසුන්ට උපදෙස් ලබාදෙන්න.

පියවර 03 - සිසුන් කණ්ඩායම් 04කට වෙන් කර ඉහත සඳහන් මාතෘකා යටතේ කෙටි ලිපි හතරක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

පියවර 04 - ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වා සමාලෝචනයක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 3**

**කාව්‍ය රසාස්වාදයේ දී අවධානය යොමු කළ යුතු අංග හඳුනා ගනිමු.**

පියවර 01 - සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් කරන්න.

පියවර 02 - එක් කණ්ඩායමකට නිර්දිෂ්ට කවි පන්තිය බැගින් බෙදා දෙන්න.

පියවර 03 - ඒ ඒ කවි පන්තිවල පහත සඳහන් ලක්ෂණ සොයා ගැනීමට උපදෙස් දෙන්න.
කාව්‍ය ආකෘතිය
තේමාව
අනුභූතිය
ශබ්ද හා අර්ථ ධ්වනි
ජීවන දෘෂ්ටිය

පියවර 04 - සිසුන් සොයාගත් කරුණු පන්තියට ඉදිරිපත් කරන්න.

පියවර 05 - සමාලෝචනය හා ඉහත මාතෘකාවලට අදාළ උදාහරණ පද්‍ය ඉදිරිපත් කරන්න.

පියවර 06 - මේ මාතෘකා යටතේ සිසුන්ට තව තවත් කාව්‍ය නිර්මාණ රැස් කිරීමට පොලඹවන්න. ඒවා රස විඳීමටත් සන්සන්දනාත්මක ව විමසා බැලීමටත් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 4**

**අපි කවි නිර්මාණය කරමු.**

පියවර 01 - විවිධ කාව්‍ය නිර්මාණ පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

පියවර 02 - නිසඳැස් හෝ සඳැස් කාව්‍ය පිළිබඳ සිසුන්ගේ අදහස් ලබා ගන්න.

පියවර 03 - කාව්‍ය නිර්මාණයේ අගය වටහා දෙන්න. පුවත්පත්වලට සිසු නිර්මාණ යොමු කරන්න.

පියවර 04 - කාව්‍ය නිර්මාණ සඳහා සුදුසු මාතෘකා කිහිපයක් පිළිබඳ සිසුන්ගේ අදහස් ලබා ගන්න.

පියවර 05 - සෑම සිසුවෙකුට ම තමන් කැමැති මාතෘකාවක් යටතේ කවි කිහිපයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

පියවර 06 - එම කවි පන්තිය කියවා සමාලෝචනයක යෙදෙන්න.

පියවර 07 - කවි නිර්මාණය කිරීමට යොමු කිරීම සඳහා සිසුන්ට පැවරුමක් දෙන්න.

## පිතෘත්වය විමල් දිසානායක

### හැඳින්වීම

- විමල් දිසානායක මහතා කවියෙකු පමණක් නොව ප්‍රවීණ සාහිත්‍ය විචාරකයෙකු වන බව සාකච්ඡා කිරීම.
- පිය සෙනෙහස පිළිබඳ ව ලියවුණු වෙනත් ගීත, කවි ආදිය ගැන විමසා බැලීම.
- එයින් එක් ගීතයක් ගායනා කිරීම.
- නියමිත පද්‍ය පන්තිය තාලානුරූප ව ගායනා කිරීම.

### අන්තර්ගතය

- බාහිර සතුරු බලවේග හා අතුරු අන්තරා හමුවේ දියණියකගේ ප්‍රබල ම ආරක්ෂකයා පියා බව
- ගමෙන් පිටව බාහිර සමාජයකට ගිය ද අධ්‍යාත්මයෙන් පියාගේ ආරක්ෂාව ම ප්‍රාර්ථනා කිරීම.
- සතියකට වරක් හෝ නිවසට පැමිණි විටත් ආරක්ෂාව, සෙනෙහස, දයාව ලබා ගැනීම.

### කාව්‍යෝපක්‍රම භාවිතය

- සිවුපද කාව්‍ය ආකෘතිය භාවිතයට ගැනීම.
- උපයුක්ත භාෂා රටාවේ විවිධත්වය ඒ අතර සරල, සුගම ව්‍යවහාර භාෂා ලක්ෂණ මෙන් ම සම්භාව්‍ය හා ව්‍යංගාර්ථවත් භාෂා ලක්ෂණ ද දක්නට ලැබීම.
- තේමාව සංවර්ධනය කිරීම සඳහා ධාරානිපාත වර්ෂාවක අවස්ථාවක් යොදා ගැනීම.
- සංකේත භාවිතය කෙරෙහි වැඩි නැඹුරුවක් පැවතීම.

  උදා ඃ වැසි අවස්ථාවක දක්නට ලැබෙන හෙණ හඬ, විදුලි කෙටීම වැනි අවස්ථා සංකේතාත්මක ව යොදා ගැනීම.
- උපමා භාවිතයට නැඹුරුවක් දක්වයි.

  උදා ඃ නයි පොළොංගු වැනි ගනඳුර අප සිරුරේ එල්ලෙයි.
- විවිධ රූපක භාවිතය

  උදා ඃ "ලේ තැවරුණු කගපත ඇති විදුලිය පැන පැන දුව යයි"

  "තෙදියත නතු කළ සක්විති රජ කෙනෙක්මි යුතු තෙදබල"
- දියණියක හා පියකු අතර සිදුවන සංවාදයක විලාසයෙන් ඉදිරිපත් කිරීම.

### ජීවන දෘෂ්ටිය

- වෙනත් කවර තරමේ ආරක්ෂාවකටත් වඩා වැඩි ආරක්ෂාවක් පියවරුන්ගෙන් දරුවන්ට ලැබෙන බව හා ලැබිය යුතු බව
- එම ආරක්ෂාව කායික ව පමණක් නොව ආධ්‍යාත්මික ව ද සමීපයේ දී පමණක් නොව දුරස්ථව ද සිටියත් සැලසිය හැකි බව
- දියණියකට මුහුණදීමට සිදුවන බාහිර සමාජ අන්තරාවන් අධික බව

### පැවරුම්

- විමල් දිසානායක මහතාගේ වෙනත් නිර්මාණ කීපයක් තෝරාගෙන ඒවායේ තේමා හඳුනා ගන්න.
- පිය සෙනෙහස ගැන විවිධ මාන ඔස්සේ ලියවුණු කවි හා ගීත එකතුවක් සකස් කරන්න.
- එබඳු කවි හා ගීත කීපයක් ගායනා කර රසවින්දනයට අවස්ථාව සලසා දෙන්න.

උදා ඃ සුළඟක් වී, අම්මා සඳකි

## අම්මා මහගම සේකර

### හැඳින්වීම

- කවියාගේ සාහිත්‍ය සහ කලා නිර්මාණ පිළිබඳ විමසා බැලීම.
- මව්ගුණ ගැන කියවෙන ගීතයක් ශ්‍රවණය කර රසවිඳීමට සැලැස්වීම.
- මව්වරුන් ගැන විවිධ දෘෂ්ටිකෝණවලින් ලියවුණු කවි, ගීත ආදි නිර්මාණ පිළිබඳ විමසමින් සාකච්ඡාවක නිරත වීම.

### අන්තර්ගතය

- මව් සෙනෙහස වඩාත් සෞන්දර්යාත්මක මෙන් ම සංවේදී ව ඉදිරිපත් කරයි.
- අව්‍යාජ ගැමි මවක සතු ගුණාංග ඇගේ චර්යා ආශ්‍රයෙන් ම ධ්වනිත කරයි.
- දරුවන් වෙනුවෙන් මවක පුරනා බෝසත් පාරමී දම් ප්‍රකට කරයි.
- විශ්වය පිළිබඳ පළමු පාඩම දරුවනට කියා දෙන්නේ ද මාපියන් ම බව විස්තර කරයි.

### කාව්‍යෝපක්‍රම භාවිතය

- සිත්ගන්නා සුලු කාව්‍ය ආකෘතියක් භාවිතයට ගැනීම.
- සංකේතාත්මක භාෂා රටාවක් යොදා ගැනීම.

  උදා ඃ "පිපිලා තිබුණි එතැන සුදු පාටට<br>
  නමක් නොමැති පුංචි මලක්"<br>
  "අම්මේ ඔබ වත කැටපතක් බව"
- ගැමි සරල වදන් භාවිතය.

  උදා ඃ "කඩයප්පන්" "තම්බා බතල දළු - ලුණු දියර ඉහ"
- සංකල්ප රූප ජනිත වන ආකාරයෙන් නිර්මාණය කිරීම.
- ගැමි සංස්කෘතික ලක්ෂණ මතු වන ලෙස බස යොදා ගැනීම.

### ජීවන දෘෂ්ටිය

- මවක දරුවන් වැදීමට මෙන් ම හැදීමට ද ගන්නා අප්‍රමාණ වෙහෙස කාව්‍යාත්මක ව විස්තර කිරීම.
- සියලු ලෝක ධර්මතා අභිභවා ලොව්තුරු මව්ගුණය ප්‍රකට කිරීම.
- තම දෛනික ක්‍රියාකාරකම් තුළින් ම විශ්වය පිළිබඳ මනා දර්ශනයක් ඉදිරිපත් කිරීම.
- කෙතරම් භෞතික සම්පත් තිබුණ ද කොතරම් ඉගෙන ගත්ත ද ලෝකය පිළිබඳ ව උපේක්ෂාවෙන් බැලීමේ ගුණය අකුරු නොදත් අම්මාට තරම් අන් අයට නොමැති බව

### පැවරුම්

- මව් ගුණය ගැන කියවෙන වෙනත් නිර්මාණ පිළිබඳ ව සොයා බැලීම හා එවැනි නිර්මාණ එකතුවක් සකස් කරන්න.
- එබඳු කවි හා ගීත ඇතුළත් ශ්‍රව්‍ය - දෘශ්‍ය පට ඇසීමට, බැලීමට සලස්වා රසාස්වාදයෙහි යෙදීමට සලස්වන්න.
- මහගමසේකර මහතාගේ කාව්‍ය නිර්මාණයන්හි දැක්වෙන විශේෂතා හඳුනා ගන්න.

## දියණියනි මොනිකා රුවන්පතිරණ

### හැඳින්වීම

- මොනිකා රුවන් පතිරණ කිවිඳියගේ නිර්මාණ පිළිබඳ හැඳින්වීමක් කිරීම
- ඇගේ නිර්මාණවලට පාදක වූ තේමාවන්හි විවිධතා හඳුනා ගැනීම
- මෙම කාව්‍ය තේමාවට සමාන තේමාවන් පාදක කර ගනිමින් බිහි වූ වෙනත් කාව්‍ය විමසා බැලීම

### අන්තර්ගතය

- අලුත උපන් බිළිඳියක ජීවිතයේ විවිධ සන්ධිස්ථානයන් පසු කිරීම
- මවක වීම දක්වා විවිධ භූමිකා නිරූපණය කිරීමට සිදුවීම
- එම භූමිකාවට අදාළ හැසිරීම් රටා වගකීම් හා යුතුකම් පැවතීම
- ළදැරියක - මවකවීම දක්වා වූ සමාජ ජීවිතය විවරණය කිරීම

### කාව්‍යෝපක්‍රම භාවිතය

- ස්වකීය කාව්‍ය තේමාව ඉදිරිපත් කිරීමට සුදුසු ආකෘතියක් ප්‍රයෝජනයට ගැනීම
- ගැහැනියකට ජීවිතයේ දී මුහුණදීමට සිදුවන විවිධ අවස්ථා පියවරෙන් පියවර නිරූපණය කිරිම
- මවක තම දයණියට විස්තර කර දෙන පරිද්දෙන් තේමාව ඉදිරිපත් කිරීම
- තේමාවට උචිත භාෂා ශෛලියක් ගොඩනගා ගැනීම

### ජීවන දෘෂ්ටිය

- ගැහැනියක උපන් දා සිට වරින්වර විවිධ ජීවන ගැටලුවලට මුහුණ දීම
- ළදැරියක, තරුණියක, මනාලියක, පතිනියක හා මවක වීම දක්වා ජීවන ස්වභාවයන් ඉදිරිපත් කිරීම

### පැවරුම්

- ජීවිතයක විවිධ අවස්ථා විවරණය කරමින් රචනා වූ ගීත, කවි සොයා බැලීම හා ඒකරාශී කරන්න.
- එම ගීත ගායනා කරමින් රසවිඳීමට අවස්ථාව සලස්වන්න. (සන්නාලියනේ වැනි ගීත)
- ජීවිතයක යථාර්ථවාදී ස්වභාවය කවරේදැයි සාකච්ඡා කරන්න.

## දෙදෙනාම දියණියෝ  බුද්ධදාස ගලප්පත්ති

### හැඳින්වීම

- බුද්ධදාස ගලප්පත්ති කවියාගේ නිර්මාණවල සුවිශේෂතා කෙටියෙන් සඳහන් කිරීම.
- කවියාගේ වෙනත් නිර්මාණ ක්ෂේත්‍ර විස්තර කිරීම.
- කාව්‍ය නිර්මාණය නිශ්ශබ්ද ව අවධානයෙන් කියවා ගැනීමට සැලැස්වීම.

### අන්තර්ගතය

- සමකාලීන සමාජ ගැටලුවක් තේමාව කොට ගැනීම.
- ඇති නැති පරතරය පිළිබඳ ව කාව්‍යාත්මක ව ඉදිරිපත් කිරීම.
- සමාජයේ එක් දැරියක් කුසට අහරක් යදිමින් සිටියි. එම සමාජයේ ම තවත් දැරියකට රස මසවුලු පිරි බත් කටක් කවා ගැනීමට දරන අප්‍රමාණ වෙහෙස නිරූපණය කිරීම.
- මේ සිදුවීම් දෙක පාදක කරගනිමින් කථකයා තුළ හටගත් සංවේදී හැඟීම් ප්‍රතිනිර්මාණය කිරීම.

### කාව්‍යෝපක්‍රම භාවිතය

- වඩාත් උචිත ආකෘතියක් භාවිතයට ගැනීම.
- සංකල්ප රූප ජනිත වන සජීවී භාෂා රටාවක් භාවිතයට ගැනීම.
- දියණියන් දෙදෙනෙකු ගෙන ස්වකීය තේමාව සංසන්දනාත්මක ව ඉදිරිපත් කිරීම.
- ආහාර ඇති නැති අවස්ථා දෙක ප්‍රයෝජනයට ගනිමින් සමාජමය පණිවිඩය ප්‍රතිනිර්මාණය කිරීම

### ජීවන දෘෂ්ටිය

- සමාජයේ පවත්නා ඇති නැති පරතරය හා ඉන් වේදනාවට පත්වන අනාගත පරම්පරාවේ ශෝකාන්තය නිරූපණය කිරීම
- සැම දරුවෙකු දෙස ම තමන්ගේ ම දරුවන් ලෙස බලා ලොව ම සුන්දර කළ යුතු බව
- මෙවැනි ඛේදවාචකයනට මුහුණ දෙන දරුවන්ගේ කායික මෙන් ම භෞතික දරිද්‍රතාව පිළිබිඹු වීම

### පැවරුම්

- නිර්මාණය සඳහා යොදා ගත් දියණියන් දෙදෙනාගේ වෙනස අවබෝධ කරගෙන ඒවා ලේඛනගත කරන්න.
- ඔවුන් දෙදෙනා නියෝජනය කරන සමාජ පන්ති දෙක හඳුනාගෙන ඉදිරිපත් කරන්න.
- මේ තේමාව ප්‍රතිනිර්මාණය කිරීම සඳහා කවියා යොදාගත් උපක්‍රම සාකච්ඡා කර ලේඛනගත කරන්න.

## මිතුරන් දෙදෙනා සහ පොරොව පරාක්‍රම කොඩිතුවක්කු

### හැඳින්වීම

- පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ ප්‍රතිභා ශක්තිය, ඔහුගේ නිර්මාණ ආශ්‍රයෙන් විමසීම
- ස්වකීය නිර්මාණකරණයෙහි අදීනව නියුක්ත වූ බව
- වෙනත් නිර්මාණකරුවන් නොදුටු තේමා තම නිර්මාණ සඳහා පාදක කරගත් බව

### අන්තර්ගතය

- කථකයා ගෙදරින් පැනවිත් දර මඩුවක කටුක රැකියාවක් කරයි.
- එහි දී විමලේ නම් යහළුවෙකු මුණ ගැසෙයි.
- මේ මිතුදම නිසා තනිකම, හුදෙකලා බව නැතිවෙයි.
- දැඩි මිතුදම පාදක කරගනිමින් කෙරෙන ජීවන විවරණයක් ලෙස නිර්මාණය ඉදිරිපත් කිරීම.

### කාව්‍යෝපක්‍රම භාවිතය

- තේමාවට උචිත සිවුපද ආකෘතියක් යොදා ගැනීම
- තේමාවට උචිත වාඩිය, ලනුමැස්ස, කැලෑ කොළේ, බැද්දේ, බීඩිය උරමු වැනි ගැමි වදන් භාවිතය
- මිත්‍රත්වය ගැන කියවෙන විමලේ, සබඳ වැනි හෘදයංගම වදන් භාවිතය
- දෙදෙනා තුළ පැවති ගැඹුරු මිත්‍රත්වය ප්‍රකට කිරීමට දර මඩුවක කටුක රැකියාව, පොරොව වතුරට වැටීම, එය ගැනීමට මිතුරා ඉදිරිපත්වීම හා අනතුරට ලක්වීම ඉන් පසුව සිදුවන ක්‍රියාදාමයක් භාවිත කිරීම

### ජීවන දෘෂ්ටිය

- නිර්ව්‍යාජ මිත්‍රත්වයේ ස්වභාවය විවරණය කිරීම
- කටුක ජීවන යථාර්ථය තුළින් මිත්‍රත්වය වඩාත් තහවුරු කිරීම
- සැබෑ මිත්‍රත්වය තුළ ඕනෑ ම පරිත්‍යාගයක් කළ හැකිවීම
- මිත්‍රත්වය නොදත් මුදලාලිගේ සමාජ ක්‍රමය විවරණය වීම
- මිත්‍ර ප්‍රතිරූපකයෝ කවරහුදැයි ධ්වනිතවීමට අවස්ථාව සැලසීම

### පැවරුම්

- සැබෑ මිතුරෙකු සතු ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- කතුවරයා යොදාගත් භාෂා ශෛලියෙහි විශේෂතා නිදසුන් සහිත ව සාකච්ඡා කර පෙළ ගස්වන්න.
- කතුවරයාගේ තෝරාගත් තවත් නිර්මාණ කීපයක තේමා හඳුනාගෙන ඉදිරිපත් කරන්න.

## එතෙර ගිය පොඩි දුවට දයාසේන ගුණසිංහ

### හැඳින්වීම

- උත්තරීතර මව් සෙනෙහසක ස්වභාවය කෙසේදැයි සාකච්ඡා කිරීම.
- කතුවරයා මෙවැනි කාව්‍ය තේමා පිළිබඳ ව දක්වන සංවේදිතාව විමසීම.
- "එතෙර ගිය පොඩි දුවට" නිර්මාණයෙහි එන සමාජ පසුබිමට සමාන තේමා රැගත් වෙනත් නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

### අන්තර්ගතය

- අපේ දූ දරුවනට විදේශිකයන්ගේ මාපිය සෙනෙහස ලැබීම පිළිබඳ පුවත්පත් වාර්තාවකින් කවියා සංවේදී වීම.
- එය පාදක කරගෙන වර්තමාන සමාජ ගැටලුවක් ප්‍රතිනිර්මාණය කිරීම.
- දරිද්‍රතාව හමුවේ දෙමාපියන් හා දරුවන් අසරණ වන ආකාරය
- එසේ වුව ද මාපිය - දරු සෙනෙහස නොසිඳෙන බව

### කාව්‍යෝපක්‍රම භාවිතය

- නිමිත්ත ලෙස පුවත්පත් වාර්තාවක් යොදා ගැනීම.
- නිදහස් මෙන් ම සිවුපද කවි ද යොදාගත් කාව්‍ය ආකෘතියක් භාවිත කිරීම.
- සිවුපද ආකෘතියේ දී එළිසමය භාවිතයට ගැනීම.
- මවක හා දියණියක අතර සිදුවන සංවාදයක් ලෙස ඉදිරිපත් කිරීම.
- සංවාදශීලී සජීවී භාෂා රටාවක් යොදා ගැනීම.

### ජීවන දෘෂ්ටිය

- දරිද්‍රතාවෙන් සපිරි සමාජය තුළ දහසකුත් දූදරුවන් දෙමාපිය සෙනෙහස යදිමින් සිටින බව
- එවැනි දරුවන් වැදූ මව්වරුන් අසරණ ව සුසුම්ලන අයුරු හෙළි කිරීම.
- දරු දුක - සෙනෙහස නොදැනෙන මිනිසුන් සිටින මව්බිම අතහැර විදේශිකයන්ගෙන් ඒ සෙනෙහස ප්‍රාර්ථනා කිරීම.
- තමා උපන් රට පිළිබඳ ව අදහසක් ඇති කර ගැනීමට ඉගියක් දැක්වීම.

### පැවරුම්

- කාව්‍ය ආකෘතිය පිළිබඳ ව විමසා බලන්න.
- මවගේ දරිද්‍රතාව සංකේතාත්මක ව ප්‍රකාශ කෙරුණු අයුරු පැහැදිලි කරන්න.
- මෙවැනි සිදුවීම් සහිත පුවත්පත් වාර්තා එක්රැස් කර සාකච්ඡා කරන්න.
- 'එතෙර ගිය පොඩි දුව' කවි පෙළ තේමා කරගත් ගීතයට සවන්දෙන්න (ගීතය විශාරද ගුණදාස කපුගේ ශිල්පියා විසින් ගායනා කරන ලද්දකි.)

## ගුරු පියාණනි කෝ. ආනන්ද හිමි

### හැඳින්වීම

- කො. ආනන්ද හිමියන් හා උන්වහන්සේගේ කාව්‍ය නිර්මාණ හඳුනා ගැනීම
- පැවිදි ගුරු හිමි නමක සහ ශිෂ්‍ය හිමි නමක අතර ඇති සබඳතාව සාකච්ඡා කිරීම
- මව්පිය සෙනෙහස රැකවරණය වෙනුවට ගුරු හිමියන්ගෙන් එබඳු සෙනෙහසක් රැකවරණයක් ලැබීමේ ආශ්චර්යය පිළිබඳ කතිකාවක් පැවැත්වීම

### අන්තර්ගතය

- ඥාති සම්බන්ධතා නොතිබුණ ද ගුරු ගෝල සම්බන්ධතාවයෙහි ප්‍රබල බව
- තමන් වහන්සේ ගුණ නුවණින් පිරි අයෙකු කිරීමට ගුරු හිමියන් ගත් උත්සාහය අගය කිරීම
- පන්සලෙන් ලබන අධ්‍යාපනයෙහි සහ ශික්ෂණයෙහි ස්වරූපය නිරූපණය කිරීම
- අසීමිත ගුරු භක්තිය හා සෙනෙහස

### කාව්‍යෝපක්‍රම භාවිතය

- සිවුපද ආකෘතිය භාවිතය
- උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය යොදා ගැනීම
- සරල බස් වහරක් යොදා ගැනීම
- මුදිත ළැම, රන් දෙනෙත වැනි රූපකාර්ථවත් පද යෙදීම
- සංකල්ප රූප මැවීම

### ජීවන දෘෂ්ටිය

- ගුරු භක්තිය
- ගුණ නුවණින් යුතු ශිෂ්‍යයෙකු බිහිකර ගැනීමේ ගුරු කාර්ය භාරය
- කෘත ගුණය

### පැවරුම්

- පද්‍ය පන්තිය තාලයට ගායනය කරන්න.
- ගුරු ශිෂ්‍ය සබඳතාව පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- ගුරු ශිෂ්‍ය සබඳතා දැක්වෙන සාහිත්‍ය නිර්මාණ හඳුනා ගෙන එම නිර්මාණ රස විඳින්න.

## වංකගිරියට මාරුවීම රත්න ශ්‍රී විජේසිංහ

### හැඳින්වීම

- නූතන යුගයේ කවීන් අතර රත්න ශ්‍රී විජේසිංහ කවියාට හිමි තැන සාකච්ඡා කිරීම
- ඔහුගේ කාව්‍ය හා ගී නිර්මාණ පිළිබඳ විමසීම
- ඔහුගේ නිර්මාණවල දැකිය හැකි ස්වාධීන කාව්‍ය ලක්ෂණ හඳුනා ගැනීම

### අන්තර්ගතය

- දිළිඳු පවුලක ස්වාමියා දූ දරුවන් හා බිරිඳ තනිකර දුර බැහැර ප්‍රදේශයක රැකියාව සඳහා පිටත් වෙයි.
- ඇය සියලු දුක් කම්කටොලු උසුළමින් දරුවන් ද හදා වඩා ගනිමින් තනිව ජීවත් වේ.
- විෂම වූ සමාජ පරිසරයක සැමියා රැකියාවේ නිරත වෙයි. ඔහුට නපුරක් සිදුවේයැයි සිතා නිවසේ නතර කර ගැනීමට ඇය උත්සාහ දරයි. ප්‍රවේශමෙන් කටයුතු කරන බව පවසමින් බිරිඳගෙන් සමු ගැනීමට ඔහු සූදානම් වේ.
- තමා වෙනුවෙන් සියලු දුක් විඳදරා ගනිමින් තම දරුවන් පෝෂණය කරමින් යහපත් කල් ක්‍රියාවෙන් යුත් බිරිඳ කෙරෙහි ඔහු තුළ අසීමිත භක්ත්‍යාදරය

### කාව්‍යෝපක්‍රම භාවිතය

- රූපක භාවිත කිරීම
- සංකල්ප රූප මැවීම
- උචිත ලෙස භාෂාව යොදා ගැනීම
- කාව්‍යමය භාෂාව

  නිදසුන් - ළැමට ඇදී එත්මැයි<br>
  දුකින් තෙත් කරත් මැයි<br>
  නුඹ චන්ද්‍රමඬල වැන්නේ
- උත්ප්‍රාසාත්මක යෙදුම්

  කුලී මාලිගාවේ

### ජීවන දෘෂ්ටිය

- කුටුම්බ සංරක්ෂණයේ දී අඹු සැමියන්ගේ යුතුකම් සහ වගකීම්
- අඹු සැමියන් අතර තිබිය යුතු ආදරය හා අවබෝධය
- සුපිරිසිදු සාමකාමී පවුල් ජීවිතයක සුන්දරත්වය

### පැවරුම්

- ගීතය ශ්‍රවණය කිරීම හා රසවින්දනයක යෙදෙන්න.
- ගීතයට අනුභූතිය සැපයූ පවුල් ජීවිතය පිළිබඳ ඇගයීමක යෙදෙන්න.
- මෙම අත්දැකීම් පාදක කරගත් වෙනත් ගීත හා පද්‍ය නිර්මාණ පිළිබඳ රසවින්දනයක යෙදෙන්න.

## ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ ආරියවංශ රණවීර

### හැඳින්වීම

- ආරියවංශ රණවීර කවියා හා ඔහුගේ නිර්මාණ හඳුනා ගැනීම
- සාහිත්‍ය කලාවට ඔහුගෙන් සිදු වූ සේවය අගය කිරීම
- නියමිත පද්‍ය පන්තිය තාලානුකූල ව ගායනය කිරීම

### අන්තර්ගතය

- හැඩයෙන්, රුවින් හා ප්‍රමාණයෙන් සමාන ගේ කුරුල්ලාගේ සහ වී කුරුල්ලාගේ හැසිරීම් රටාව චිත්‍රණය කරයි.
- දෙන දේ කා ජීවත්වන ගේ කුරුල්ලාගේ ලෝකය පටු ය. හුදකලාය, සාමූහිකව ජීවත්වන වී කුරුල්ලාගේ හැසිරීම් විචිත්‍ර ය. සිත් ගන්නා සුලුය. විසිතුරු හැඟීම් ජනනය කරයි.
- වී වගාවට හානි කරන හෙයින් ගොවීන්ගෙන් අපමණ හිරිහැර ලබයි. නමුත් කවියා ඒ පිළිබඳ ද්වේෂ නොකරයි.

### කාව්‍යෝපක්‍රම භාවිතය

- සිවුපද ආකෘතිය යොදා ගැනීම
- ජන කවි සම්ප්‍රදායෙන් අභාසය ලැබීම
- සංකල්ප රූප මැවීම
- ධ්වනිතාර්ථවත් පද යෙදීම
  නිදසුන් - කීං හඬ නඟා වැනි යෙදුම්
- සංක්ෂිප්ත බව

### පැවරුම්

- පද්‍ය පන්තිය තාලයට ගායනය කරන්න.
- ගේ කුරුල්ලා සහ වී කුරුල්ලාගේ ස්වරූපය හා හැසිරීම් රටාව පිළිබඳ නිරීක්ෂණය යෙදෙන්න.
- ගේ කුරුල්ලාගේ හා වී කුරුල්ලාගේ සමාන අසමාන කම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක යෙදෙන්න.

## සුරා සොඩ සැමි වලප යමුනා මාලනී පෙරේරා

### හැඳින්වීම

- ජන සමාජය වසාගෙන පවත්නා උවදුරු විවිධ ස්වරූප ගන්නා බව
- මත් උවදුර එවන් එක් සමාජ ව්‍යසනයක් බව
- මෙය ශ්‍රී ලාංකේය සමාජයේ සුලබ ප්‍රවණතාවක් වුව ද මෙකී තේමාව ඔස්සේ බිහි වූ සාර්ථක පද්‍ය නිර්මාණ විරල බව

### අන්තර්ගතය

- සුරා සොඩ සැමියෙකු තම මියගිය බිරිඳ පිළිබඳ කරන අතීතාවර්ජනයකි
- ව්‍යාජ ගුණ කථනයක ස්වරූපය ගන්නා එම අතීතාවර්ජනය තුළින් ඔවුන්ගේ කුටුම්බ ජීවිතයේ යථා ස්වභාවය විවරණය කිරීම

### කාව්‍යෝපක්‍රම භාවිතය

- ස්වකීය තේමාව කුළුගැන්වීම සඳහා ඉවහල් කර ගන්නා දෘෂ්ටිකෝණය නව්‍ය වූවකි.
- සුරා සොඩ සැමියන් නිසා වැලපෙන බිරියන් සුලබ වුවත් තමන් නිසා පීඩාවට පත් බිරිය වෙනුවෙන් වැලපෙන සුරා සොඩ සැමියන් විරල බව හා එහි පවත්නා ව්‍යාජත්වය
- සැමියාගේ වැලපීම මෙන් ම ඒ වෙනුවෙන් යොදාගන්නා බස් වහර ද උපහාසය මුසු උත්ප්‍රාසවත් විලාසයක් ගැනීම
- සැමියාගේ මුවට නංවන වදන් තුළින් මත්පැන් විසින් ගිල ගන්නා ලද ඔවුනගේ කුටුම්බ ජීවිතයේ බිඳ වැටීම මෙන් ම ඒ නිසා කාන්තාවට අත්වන ඉරණම විවරණය කිරීම
- යසවතිය, සිරිමතිය, රසවතිය, පතිවතිය යනාදී වශයෙන් තම බිරිඳ අමතමින් සැමියා විසින් සිදුකරන ව්‍යාජ ගුණ කථනය මගින් සුරාව විසින් පරිහානියට පත් කළ ඔහුගේ මානසික හා චරිත ස්වභාවය පිළිබිඹු කිරීම

### ජීවන දෘෂ්ටිය

- දරුණු සමාජ ව්‍යසනයක් වන මත් උවදුර සහ එතුළින් පැන නගින අතුරු ව්‍යසනයන්ගේ ගොදුරක් බවට පත් වන ශ්‍රී ලාංකේය පවුල් සංස්ථාවේ බිඳ වැටීම යථා ස්වරූපයෙන් නිරූපණය කිරීම
- මත් උවදුර සහ බිඳුණු පවුල් සංස්ථාව තුළ කාන්තාවට අත්වන ඉරණම

### පැවරුම්

- ඉහත තේමාව ඔස්සේ රචනා වූ ගීත හා පද්‍ය නිර්මාණ ඒකරාශී කරන්න.
- එම නිර්මාණ සඳහා උපයෝගී කොට ගෙන ඇති විවිධ දෘෂ්ටිකෝණ හඳුනා ගනිමින් ඒවායේ උචිත අනුචිත බව විමසන්න.
- මත් උවදුර හා ඒ මගින් පැන නගින සමාජ ව්‍යසනයන් පිටු දැකීම සඳහා කලා කෘතියකින් ඉටු කළ හැකි මෙහෙය යන මැයෙන් නිර්මාණාත්මක රචනයක් ලියන්න.

## වලව්වට වැසි ඇවිත් නන්දන වීරසිංහ

### හැඳින්වීම

- නූතන පරපුරේ කවියෙකු ලෙස නන්දන වීරසිංහ කවියා හා ඔහුගේ නිර්මාණ හඳුනා ගැනීම
- කවි පන්තිය ගායනා කිරීම
- මෙම තේමාව රැගත් වෙනත් කාව්‍ය නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා කිරීම

### අන්තර්ගතය

- ගතානුගතික ව අදහස් මතිමතාන්තරවල යුක්ත පැරණි ප්‍රභූ සමාජයේ ගරා වැටීම නිරූපණය කරයි
- එම සමාජ පන්තියේ වැඩිහිටි සමාජයේ අදහස් එම පරපුරේ තරුණ සමාජය විවේචනාත්මකව දකින අයුරු
- නූතන සමාජයේ වෙනස්වීම්වලට අනුව වෙනස්වීමට කැමති එම සමාජ ස්තරයේ අදහස්වල ස්වරූපය

### ජීවන දෘෂ්ටිය

- නූතන සමාජ විපර්යාස හමුවේ පැරණි සාම්ප්‍රදායික අදහස් බිඳ වැටීම
- සාම්ප්‍රදායික ප්‍රභූ පන්තියේ ගතානුගතික අදහස්වලට ප්‍රතිවිරුද්ධව මතුවන එම පරපුරෙහි ම තරුණ පරම්පරාවේ අදහස්වල ස්වරූපය

### කාව්‍යෝපක්‍රම භාවිතය

- පැරණි සහ නූතන භාෂා ව්‍යවහාරය යොදා ගැනීම
- රූපකාර්ථ බහුල ලෙස භාවිතය
- උපමා භාවිතය
- සංකල්ප රූප මැවීම
- පද සංඝටනය

### පැවරුම්

- මෙම තේමාව රැගත් වෙනත් කාව්‍ය නිර්මාණ රස විඳින්න.
- කවියා මෙම පද්‍ය පන්තිය තුළ භාෂාව හසුරුවා ඇති ආකාරය අගය කරන්න.
- කවියාගේ ප්‍රතිභාව පිළිබඳ සාකච්ඡා කරන්න.

## ලීස්තර වැට එරික් ඉලයප්ආරච්චි

### හැඳින්වීම

- නූතන කවියෙහි එරික් ඉලයප්ආරච්චි කවියාට හිමි ස්ථානය පිළිබඳ විමසීම
- ඔහුගේ සෙසු ගද්‍ය පද්‍ය නිර්මාණ සඳහා විෂය කරගත් අත්දැකීම් සහ ඒවායේ සුවිශේෂතා කෙටියෙන් හඳුන්වා දීම

### අන්තර්ගතය

- ලීස්තර වැට තුළින් ලෝකය බැලීම නම් වූ සංකේතාත්මක සංසිද්ධිය ඔස්සේ සමාජයේ එක් ස්තරයක් පිළිබඳ ගැඹුරු විවරණයක් සිදු කිරීම

### කාව්‍යෝපක්‍රම භාවිතය

- කවියේ මාතෘකාව ප්‍රමුඛ සමස්ත බස් වහර සංකේතාත්මක ස්වරූපයක් ගැනීම
- ගැඹුරු ජීවන අත්දැකීමක් සරල සංසිද්ධියක් තුළට කැටි කොට ඉදිරිපත් කිරීම

### ජීවන දෘෂ්ටිය

- සමාජය විසින් හෝ තමා විසින් ම හෝ පනවාගත් විවිධ වූ සීමා බන්ධන නැමැති රාමු තුළින් ජීවිතය දෙස බැලීමට හුරු වූ පුද්ගලයා එම රාමුව තුළ ම සිරගත වන ආකාරය සංකේතාත්මක ව නිරූපණය කිරීම
- මෙවන් කායික මානසික ආකෘති තුළ සිරගත වූවකුගේ අත්දැකීම් මෙන් ම ජීවන දෘෂ්ටිය ද ප්‍රසාරණය නොවී පටු සීමාවක පමණක් විහිදෙන අයුරු විවරණය කිරීම
- විවිධාකාර සීමා බන්ධනවලින් ස්වයං සිරගත වීම නිසා පුද්ගලයා අත්විඳින පසුගාමී, පරාජිත, ශෝකී මනෝභාවය විවරණය කිරීම

### පැවරුම්

- සරල සංසිද්ධියක් පාදක කොට ගෙන ගැඹුරු ජීවන අත්දැකීමක් විවරණය කරමින් බිහි වූ වෙනත් කවි, ගීත නිර්මාණ එක්රැස් කරන්න.
- එම නිර්මාණ සඳහා පාදක වූ අත්දැකීම හා ඒවායෙහි ගැබ්වූ ජීවන දෘෂ්ටිය වෙන් කොට දක්වමින් පොත් පිංචක් සකස් කරන්න.

**කෙටිකතා**

**නිපුණතාව 5.0** ඃ විචාර මූලධර්මවලට අනුගත ව කෙටිකතා විචාරය කරයි.

**නිපුණතා මට්ටම** ඃ 5.1 නිර්දිෂ්ට කෙටිකතා විචාරය කරයි.
5.2 කෙටිකතා කියවා ලබාගන්නා දැනුම නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 48 යි.

**ඉගෙනුම් ඵල**

- නිර්දිෂ්ට කෙටිකතා කියවා ඒවායේ අත්දැකීම් විස්තර කරයි.
- නියමිත කෙටිකතාවල සන්දර්භයේ දැකිය හැකි සුවිශේෂතා සොයා බලයි.
- චරිත නිරූපණවල වෙනස්කම් වාචික ව ඉදිරිපත් කරයි.
- නියමිත කෙටිකතාවල සංවාදාත්මක අවස්ථා මතුකර පෙන්වයි.
- යොදා ඇති සංකේත භාවිතයේ හා කථාවේ උචිතානුචිත බව පෙන්වා දෙයි.
- නිර්දිෂ්ට කෙටිකතා කියවා ඒවායේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ හඳුනාගෙන ගොනු කරයි.
- ශිල්පක්‍රම භාවිත කර නිර්මාණාත්මක ලේඛන කාර්යයේ නියැලෙයි.
- නිර්දිෂ්ට පාඨවල අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.
- තම අත්දැකීම් ඇසුරෙන් කෙටිකතා නිර්මාණය කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්වැලක්**

**නියමිත කෙටිකතා**

1. කොළඹ ගමන - සෝමරත්න බාලසූරිය
2. අපේක්ෂා - පියසීලි විජේමාන්න
3. තාත්තාගේ මළගම - ජයතිලක කම්මැල්ලවීර
4. මාවතේ දරුවෝ - දයාසේන ගුණසිංහ
5. ප්‍රදීපාගාරය යට - රංජිත් ධර්මකීර්ති

**ක්‍රියාකාරකම 1** **නිර්දිෂ්ට කෙටිකතා කියවා ඒවායේ අත්දැකීම් ප්‍රකාශ කරමු.**

පියවර 01 - නිර්දිෂ්ට කෙටිකතා හොඳින් කියවීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 02 - එම කෙටිකතාවල අත්දැකීම් ලියා ගැනීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 03 - ලියන ලද අත්දැකීම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 04 - අත්දැකීම් ඇසුරෙන් කෙටිකතාවක් නිර්මාණය කිරීමේ පියවර පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර 05 - ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සමාලෝචනය කර ගුරුවරයා විසින් නව අත්දැකීම් අනාවරණය කරන්න.

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාකාරකම 2** | | | **සන්දර්භයේ සුවිශේෂතා හඳුනා ගනිමු.** |
| | පියවර 01 | - | සිසුන් කණ්ඩායම් කරන්න. |
| | පියවර 02 | - | නියමිත කෙටිකතා කියවීමට සලස්වන්න. |
| | පියවර 03 | - | කථා සන්දර්භයේ දැකිය හැකි සුවිශේෂතා කිහිපයක් මතුකොට ඒ ඒ කණ්ඩායම්වලට වෙන් කොට ගවේෂණයකට ඉඩ සලස්වන්න. |
| | පියවර 04 | - | සන්දර්භයේ දැකිය හැකි සුවිශේෂතා අඩංගු පිළිතුරු ඒ ඒ කණ්ඩායම් අනුව ඉදිරිපත් කිරීමට ඉඩ සලස්වන්න. |
| | පියවර 05 | - | ලියන ලද පිළිතුරු කණ්ඩායම් නායකයන් මගින් පන්තියට ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න. |
| | පියවර 06 | - | පිළිතුරුවල යෝග්‍ය බව හා විචාරාත්මක බව තක්සේරු කරන්න. |
| | පියවර 07 | - | ගුරුවරයාගේ මැදිහත්වීමෙන් සිසුන් ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගෙන සමාලෝචනයක් කරන්න. |
| **ක්‍රියාකාරකම 3** | | | **නියමිත කෙටිකතාවල චරිත නිරූපණයේ වෙනස්කම්, සංවාදාත්මක අවස්ථා, සංකේත භාවිතය හා කතාවේ උචිතානුචිත බව යන කරුණු ඉදිරිපත් කරමු.** |
| | පියවර 01 | - | සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න. |
| | පියවර 02 | - | එක් එක් කෙටිකතාවක් කියවා ඉහත සඳහන් කරුණු ඔස්සේ අධ්‍යයනය කර කරුණු වාචික ව ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් ලබා දෙන්න. |
| | පියවර 03 | - | සිසු කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න. |
| | පියවර 04 | - | ඉදිරිපත් කිරීම් පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න. |
| **ක්‍රියාකාරකම 4** | | | **කෙටිකතාවල නිර්මාණාත්මක භාෂා ලක්ෂණ උපුටා දක්වමු.** |
| | පියවර 01 | - | සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. |
| | පියවර 02 | - | කණ්ඩායම්වලට නිර්දිෂ්ට කෙටිකතාවක් බැගින් ලබා දෙන්න. |
| | පියවර 03 | - | එම කෙටිකතාවල භාෂා ලක්ෂණවල සුවිශේෂතා උපුටා ලැයිස්තු ගත කිරීමට උපදෙස් දෙන්න. |
| | පියවර 04 | - | අලුත් කරුණු රැස් කිරීමට යොමු කරන්න. |
| | පියවර 05 | - | කරුණු සමාලෝචනය කර අලුත් කරුණු එක් කරමින් ඇගයීමක් කරන්න. |

**ක්‍රියාකාරකම 5** **කෙටිකතා නිර්මාණයේ යෙදෙමු.**

පියවර 01 - සිසුන් සමග කෙටිකතාවට පාදක වූ වස්තු බීජයක් පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

පියවර 02 - එවැනි කෙටිකතාවක් සඳහා යොදා ගත හැකි වස්තුබීජ සිසුන්ගෙන් ලබාගන්න.

පියවර 03 - එම වස්තු බීජ පිළිබඳ ව ද සිසුන් සමග කෙටියෙන් අදහස් හුවමාරු කර ගන්න.

පියවර 04 - අභිමත පරිදි තෝරාගත් එක් වස්තු බීජයක් යොදාගෙන කෙටිකතාවක් තනි ව නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.

පියවර 05 - ලියන ලද කෙටිකතාවලින් අහඹු ලෙස තෝරාගත් කෙටිකතා කිහිපයක් පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

පියවර 06 - එම කෙටිකතා ඇතුළත් කෙටිකතා සංග්‍රහයක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

**කොළඹ ගමන සෝමරත්න බාලසූරිය**

**අත්දැකීම**

සාම්ප්‍රදායික ගැමි වට පිටාව තුළ හැදී වැඩුණු දරුවකු නාගරික ආටෝප සාටෝප සහිත ජීවිතය සිතින් මෙන් ම කයින් ද ස්පර්ශ කරන ආකාරය නිරූපිත ය.

**දෘෂ්ටි කෝණය**

කථකයා ළමයෙකු වන මෙම කතාව උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයෙන් රචනා වී ඇත.

**කථා වින්‍යාසය**

සංවාද බහුල ය. හේතුඵල සබඳතාවක් මත සිද්ධි එකින් එක ගැළපී කථා වින්‍යාසය ගොඩ නැගී ඇත. සොහොයුරන් දෙදෙනාගේ සංවේදී බව, අව්‍යාජ ගැමියකු ලෙස ඔහු හැසිරෙන ආකාරය, සහෝදරත්වය මෙහි නිරූපිත ය.

**පරිසර වර්ණනා**

ගැමි පරිසරයෙන් නාගරික පරිසරය වෙත සංක්‍රමණය වන ළමා සිතෙහි ඇතිවන ප්‍රහර්ෂය මෙහි එන පරිසර වැනුම් මගින් නිරූපණය වෙයි. පරිසර වැනුම් බහුල ව යොදා ගනියි.

**චරිත නිරූපණය**

මෙම කෙටිකතාවෙහි එන කතා නායකයා සැබෑ ගැමි දරුවෙකි. නාගරික ජීවිතයෙහි අපූරු සුන්දරත්වයක් ඇතැයි එය සිතින් ස්පර්ශ කරනසුලු චරිතයකි.

**අවස්ථා හා සිද්ධි නිරූපණය**

කොළඹ ගමන යාමට පළමුව පවුලේ උදවිය ඊට සූදානම් වන ආකාරය නාට්‍යානුරූපී ය. රූපකාර්ථවත් ය. එසේ ම සුවපහසුව ඇති කොළඹ ගෙදර ගත කරන දෙවන දිනයේ දී ම ඔහු පෙළන උදාසීන බව මැනවින් නිරූපණය වෙයි. නාගරිකයන්ගේ අධිවේගී, අවිවේකී ජීවිතය, සීමිත ඉඩකඩ මෙම කෙටිකතාවෙන් ඉස්මතු වන්නේ සියුම් ආකාරයෙනි.

**ජීවන දෘෂ්ටිය**

දුර සිට දකින සුන්දරත්වය යථාර්ථයක් නොවන බව ළමයා නාගරික ජීවිතයෙන් ඉතා ඉක්මනින් හෙම්බත් වීමෙන් පෙනී යයි. පරිසරයෙනුත්, අව්‍යාජ ජීවන ඇවතුම් පැවතුම් ආදියෙනුත් ලැබෙන ජීවන සුවය අන් සියල්ල අභිභවා සිටින බව කතාව අවසානයෙහි කියවෙයි.

**භාෂාව**

සරල සුගම ව්‍යවහාර භාෂාවක් යොදාගෙන ඇති අතර සංවාද ආදියෙන් උපයුක්ත භාෂාවට ප්‍රාණවත් බවක් ලැබී ඇත.

## අපේක්ෂා පියසීලි විජේමාන්න

### අත්දැකීම

ධනපති හා නිර්ධන පාන්තික කාන්තා චරිත දෙක ආශ්‍රිත ව ඔවුන්ගේ දෙමව්පියන් හැසිරෙන ආකාරයත්, උත්සාහය මගින් නිර්ධන පන්තියේ සාමාජිකත්වය ජයගන්නා බවත් ඉස්මතු කරවන සිද්ධියක් කතාවට පාදක කොටගෙන ඇත.

### කථා වින්‍යාසය

ධනපති පාන්තික සමාජයේ "භාග්‍යා" නම් දියණියගේ අධ්‍යාපනයේ නිෂ්ඵල භාවයත්, "සුමනාවතී" නම් නිර්ධන පාන්තික සමාජයේ මෙහෙකාර ස්ත්‍රියකගේ "අපේක්ෂා" නම් දිළිඳු දියණියගේ අධ්‍යාපනයේ සඵලතාවත් පෙන්නුම් කිරීමට උත්සාහ කෙරෙන කතා පුවතකි. මෙහි දී අභිමතාර්ථ සාධනය පිණිස පන්ති භේදය හෝ සම්පත් ආඪ්‍යත්වය අනවශ්‍ය බවත් උත්සාහය හා උනන්දුව පමණක් අවශ්‍ය බවත් සංවාද හා සිද්ධි ආශ්‍රිත ව කෙරෙන විවරණයකි.

### චරිත නිරූපණය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය අසල ඔගස්ටා කන්ද මත පිහිටි නිවසක වෙසෙන නාලක හා භාග්‍යා දූපුතුන්ගේ මව වන "හාමිනේ" නමින් සඳහන් ධනවත් පවුලක මව ප්‍රධාන චරිතය හොබවයි. සෙසු චරිත වන්නේ සුමනාවතී නම් දිළිඳු මෙහෙකාරිය හා ඇයගේ දියණිය වන අපේක්ෂා, නිවසේ රියදුරු වික්‍රමබාස්, චතුර, අනූෂා හා දීපිකා, සරත් යන අවශේෂ චරිතයි.

### පසුබිම් වර්ණනා/ සංකේත භාවිතය

ඉංග්‍රීසි බස සිංහල බස සමග මිශ්‍රකොට කථනය සඳහා යොදා ගැනීම විශේෂත්වයකි. ධනවත් පවුල නියෝජනය කළ භාග්‍යාගේ චරිතය උද්දීපනය කිරීමට යොදා ගැනුණු පරිසර වර්ණනාත් බහුල ලෙස ඊට උචිත සංකේත භාවිතයත් අපේක්ෂාගේ අපේක්ෂාව මුදුන් පත්කිරීමට යොදාගත් පරිසර වර්ණනාත් ඊට සුදුසු සංකේතත් මෙහි තන්හි තන්හි යොදා ගෙන ඇත.

### අවස්ථා හා සිද්ධි නිරූපණය

අපේක්ෂාගේ දිළිඳු මෙහෙකාර මව වන සුමනාවතී විසින් ඉදිරිපත් කරනු ලබන සංවාද පාඨක සිත් සසල කිරීමට සමත් ය.

"හාමු බේබිගේ ගවුම් පොඩි කෙල්ලට දෙනවා. ඒකිට හොඳ ඇඳුමක් අරගන්න මට සල්ලි නෑ............. "

භාග්‍යාගේ පියා විසින් ඉදිරිපත් කළ ධනේශ්වර පන්තියේ බලවතුන්ගේ ඇති හැකි බව ඉදිරිපත් කිරීමට යොදාගත් සංවාද අවස්ථාවෝචිත ය.

### භාෂාව

එදිනෙදා භාවිතයට ගැනෙන ව්‍යවහාරික සරල සිංහල බසට ඇතැම් තන්හි ඉංග්‍රීසි බසින් ගත් වදන් එලෙසින් ම යොදාගෙන ඇත.

## තාත්තගේ මළගම ජයතිලක කම්මැල්ලවීර

**තේමාව**

ජීවත් ව සිටිය දී සිය පියාට නොසලකා මියගිය පසුව වඩාත් උසස් අයුරින් මළගම වැඩ නිමකිරීමට තැත් කරමින් සිය තනතුරේ ගෞරවය රැක ගැනීමට අදහස් කළ එක් පුතෙකු මුහුණපාන දුෂ්කරතා හා අනෙක් පුතාගේ අසරණ භාවයත් මෙහි තේමාව වශයෙන් යොදාගෙන ඇත.

**දෘෂ්ටි කෝණය**

උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා වී ඇත.

**කථා වින්‍යාසය**

අනුලා සහ ඇගේ සැමියා, ජයරත්න නම් සොහොයුරා ආදී චරිත මගින් පියාගේ මළගම සඳහා සූදානම් වූ ආකාරයත් සොහොයුරා හා සොයුරියගේ ස්වරූපයත් විස්තර කෙරේ.

**චරිත නිරූපණය**

මෙහි මූලික ව නිරූපිත චරිත වනුයේ අනුලා, ඇගේ සැමියා, ජයරත්න හා ඒඩ්වින් අයියා ය.

**අවස්ථා හා සිද්ධි නිරූපණය**

අනුලා සහ සැමියා අතර සිදුවන සංවාද ඇසුරින් කතා විකාශනයට ප්‍රවිශ්ට වේ. ඔවුන් සිය පියාගේ මළගම සඳහා යාමත්, එහි දී ඇති වූ අවමඟුල් සංවිධාන කටයුතුත් ආශ්‍රිත ව අවස්ථා හා සිද්ධි නිරූපණය වේ.

**ජීවන දෘෂ්ටිය**

සමාජයේ ඇතමුන් අතර පවත්නා හරසුන් සාටෝපවත් ජීවන රටාව හා චර්යා ධර්ම මෙහි දී උපහාසයට ලක් කෙරේ.

**භාෂාව**

උපමා සහිත සංවාදාත්මක වාක්‍ය යොදා ගැනීම හා සරල බස් වහර මෙහි දක්නට ලැබේ.

**මාවතේ දරුවෝ දයාසේන ගුණසිංහ**

**අන්දැකීම**

එක ම නාගරික පරිසරය තුළ හැදීවැඩෙන දූ දරුවන්ගේ ළමා ලෝකයේ සුන්දරත්වය සමානත්වයෙන් විඳිය නොහැකි බවත් ධනපති නිර්ධන පාන්තික සමාජයේ දැකිය හැකි විෂමතා දැක්වීම හා පන්ති භේදය තේමාව ලෙසින් යොදාගෙන ඇත.

**දෘෂ්ටි කෝණය**

ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා වී ඇත.

**කථා වින්‍යාසය**

මධ්‍යම පාන්තික සමාජයේ විවිධ පැතිකඩ හා සාමාජිකයන්ගේ වෙනස් චරිතාපදානයන් භූමිකා කිහිපයක් මගින් විවරණය කෙරේ.

දැරියගේ මව සමග රෝහලේ සේවය කරන තරුණ වෛද්‍යවරයෙකුගේ අනියම් සබඳතා අතර සිද්ධි කථනයත්, සැර පරුෂ, මැරවර සිය සැමියාගේ චරිතයත්, නිරූපණය කරමින් දියණියගේ ළමා ලෝකයේ හැසිරීම් හා මනෝභාවයන් ඉස්මතු කෙරෙන සිද්ධීන් ඔස්සේ කථා වින්‍යාසය සැකසී ඇත.

**චරිත නිරූපණය**

කතා නායකයා වන්නේ කථකයා ය. පෞද්ගලික රෝහලක තරුණ වෛද්‍යවරයෙක් හා අනියම් සබඳතා ඇති විවාහක ස්ත්‍රියක, සිය සැඩපරුෂ සැමියා, සිය සිඟිති ළදැරිය හා ඇයගේ රැකවරණය සලසන සේවිකාව යන චරිත මෙහි නිරූපිත ය.

**අවස්ථා හා සිද්ධි නිරූපණය**

මාවතේ දූ දරුවන්ගේ ජීවන තොරතුරු හා ඔවුන්ගේ දෛනික හැසිරීම් කතාවේ වැඩි වශයෙන් විවරණය කෙරේ. පෞද්ගලික සාත්තු නිවාසයේ තොරතුරු එහි පෞරාණික බව ද අවස්ථානුකූල ව වර්ණනා ස්වරූපයෙන් දැක්වේ. ප්‍රධාන වශයෙන් මාවතේ දරුවන් දෙස නෙත් යොමු කරන සිඟිති දියණියන් සිය මව සමග අනියම් සබඳතා ඇති තරුණ වෙදැදුරාත් රෝහල් සේවකයා සමග සබඳතා පවත්වන සේවිකාවත් ඇයගේ හැසිරීම් රටාවත් අවස්ථානුකූල ව විවරණය කෙරේ.

**ජීවන දෘෂ්ටිය**

බිරිඳ, සේවිකාව, තරුණ වෛද්‍යවරයා හා රෝහල් සේවකයාගේ චරිතවලින් සමාජයේ විවිධ චරිතවල සැඟවුණු හැසිරීම්වල ස්වභාවය අනාවරණය කරන අතර දියණියගේ පියාගේ දාමරික, සැර පරුෂ, අකාරුණික වදන් හා ඔහුගේ චෛතසික ස්වභාවය ජීවන දෘෂ්ටීන්හි විවිධතා පෙන්නුම් කෙරේ.

**භාෂාව**

සරල උපමා හා ඉංග්‍රීසි වදන් කිහිපයක් සහිත ව කථන ව්‍යවහාරය යොදාගෙන ඇති සංවාද වාර්තා ශෛලියෙන් යුක්ත වුවත් සුඛනම්‍ය ස්වරූපයක් ගනියි.

**ප්‍රදීපාගාරය යට රංජිත් ධර්මකීර්ති**

**අත්දැකීම**

ධීවර දිළිඳු පවුලක සමන්තිකා නම් කුඩා දැරියක් පියා හා මව අහිමිවීමෙන් පසු මිත්තනිය සමග ජීවත් වෙයි. මිය ගිය ඇගේ පියා නැවත එනතුරු බලා සිටීමත් සිය නිවස අසල "ප්‍රදීපාගාරය" නැරඹීමට පැමිණෙන සමවයස් කාණ්ඩයේ දියණියක හා ඇගේ දෙමව්පියන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමත් මෙහි තේමාව ලෙස යොදා ගෙන ඇත.

**දෘෂ්ටි කෝණය**

උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා වී ඇත.

**කථා වින්‍යාසය**

සංවාදාත්මක හා වාර්තාමය සිද්ධි උපයෝගී කොටගෙන කතාව ඉදිරිපත් කෙරේ.

**පරිසර වර්ණනා**

ප්‍රදීපාගාරය බැලීමට යාමේදී ඒ හා අවට මුහුද හා පරිසරයේ ස්වභාවය ද හා සුන්දරත්වය ද නිරූපිත ය. සමන්තිකා තාප්පය උඩට වී සිය මිය ගිය පියාණන් එනතුරු රැඳී සිටින ආකාරය ද සිත්ගන්නා අයුරින් විවරණය කර ඇත.

**චරිත නිරූපණය**

මෙහි දී මූලික ව නිරූපණය වන්නේ සමන්තිකාගෙ චරිතයයි. ඇගේ මිත්තනියන්ගේ හා ප්‍රදීපාගාරය නැරඹීමට එන අමුත්තන්ගේ චරිත ද මෙහි දී සමන්තිකාගේ චරිතය කෙරෙහි බලපෑම් ඇති කරයි.

**අවස්ථා හා සිද්ධි නිරූපණය**

ප්‍රදීපාගාරය නැරඹීම පිණිස පිටව ගිය මධ්‍යම පාන්තික පවුලක පියා, මව සහ කුඩා දියණියක පිළිබඳ අවස්ථා නිරූපණයන් කෙරේ. ප්‍රදීපාගාරය අසල වෙසෙන මිත්තනියන් සමග වෙසෙන සමන්තිකා නම් දෙමව්පියන් අහිමි කුඩා දියණිකගේ වත ගොත විවරණය කෙරේ.

**ජීවන දෘෂ්ටිය**

පිය සෙනෙහස අහිමිවීමෙන් හා තම මව දෙවෙනි විවාහයක් කර ගැනීමෙන් මව් සෙනෙහසක් නොමැති ව අනාරක්ෂිත භාවයට පත්වන සමන්තිකා කෙරෙහි ඇතිවන සානුකම්පිත දෘෂ්ටිය මෙහි දී විවරණය වේ.

**භාෂාව**

ගැමි වහර මුසු සරල සංවාදාත්මක සරල බස් වහරක් යොදාගෙන ඇත.

භාෂාව හා ව්‍යාකරණය

**නිපුණතාව 6.0** ඃ නිවැරදි ව හා නිරවුල් ව බස හසුරුවමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** ඃ
6.1 තර්කානුකූල ව හා විචාරශීලී ව කරුණු සංවිධානය කර ගනිමින් නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියයි.
6.2 සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි.
6.3 සම්මත රීති අනුගමනය කරමින් නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි.
6.4 සිංහල වාංමාලාව හා භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය හා පරිචය, නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** ඃ 60යි

**ඉගෙනුම් ඵල** ඃ

- ලේඛන ව්‍යවහාරයේ සම්මත රීති පැහැදිලි කරයි.
- කතා ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය අතර වෙනස සන්සන්දනාත්මක ව දක්වයි.
- ලේඛන ව්‍යවහාරයේ දී සම්මත රීති අනුගමනය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- සම්මත වාක්‍ය රීති අනුගමනය කරමින් ලියයි.
- වාංමාලාව හා භාෂා සම්ප්‍රදායට අදාළ සංකල්ප නිර්වචනය කරයි.
- නිර්මාණාත්මක ලේඛනයේ දී භාෂා සම්ප්‍රදායන් උචිත ලෙස භාවිත කරයි.
- භාෂා සම්ප්‍රදායන් සමාජ, සංස්කෘතික හා සාහිත්‍යමය වටිනාකම අගය කරයි.
- වාංමාලාවට හා භාෂා සම්ප්‍රදායට අදාළ වචන යෙදුම් හා කතා එක්රැස් කරයි.
- පෝෂණය කරගත් වාංමාලාව භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.
- සාරාංශකරණයේ දී සැලකිය යුතු කරුණු විස්තර කරයි.
- සාරාංශකරණයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- දෙන ලද විවිධ පාඨ සාරාංශ කොට දක්වයි.

වාක්‍යවල කාරක භේදය

**1. කර්තෘ කාරක**

ක්‍රියාව කරන්නේ කර්තෘ ය. ක්‍රියාව කරන්නා ගැන කියැවෙන කාරකය කර්තෘ කාරක ය.

**කර්තෘ කාරක ප්‍රභේද**

1. අනතීත කාල කර්තෘ කාරක
2. අතීත කාල කර්තෘ කාරක

**1. අනතීත කාල කර්තෘ කාරක**

වර්තමාන සහ අනාගත යන කාල ද්වය අනතීත කාල නම් වෙයි.

න, නු, නා, ආ, ඉ යනු අනතීත කාල කර්තෘ කාරක ප්‍රත්‍යය වේ.

බල + න

බල + නු

බල + නා

බල + ආ (බලා)

බනි + ඉ (බණියි)

**2. අතීත කාල කර්තෘ කාරක**

ක්‍රියාව සිදුකොට අවසන් වූ කාලය අතීත කාලයයි. එම කාලයට අයත් ක්‍රියාව කරන්නා හඟවන කාරකය අතීත කාල කර්තෘ කාරකයයි.

ඉ ඊ උ ඌ ඇ

| | | | |
|---|---|---|---|
| රක් + ඉ | - රැකි | රක් + ඉ | - රැකි |
| බල + ඊ | - බැලී | පිහිට + ඉ | - පිහිටි |
| මර + ඊ | - මැරී | | |
| බල + උ | - බැලු | | |
| බල + ඌ | - බැලූ | | |
| න + ඇ | - නෑ | | |
| ක + ඇ | - කෑ | | |

**2. කර්ම කාරක**

ක්‍රියාව විඳිනුයේ කර්මයයි. ක්‍රියාවේ විඳීමක් හැඟවෙන කාරකය කර්ම කාරක යි. ක්‍රියාව සිදුවන කාලය පදනම් කොටගෙන කර්ම කාරකය කොටස් දෙකකට බෙදයි.

**කර්ම කාරක ප්‍රභේද**

1. අනතීත කාල කර්ම කාරක
2. අතීත කාල කර්ම කාරක

**1. අනතීත කාල කර්ම කාරක**

අනතීත කාල කර්ම කාරක ප්‍රත්‍යය කිහිපයකි.

න නු නා

මෙම ප්‍රත්‍යය යෙදීමේ දී ධාතුව හා ප්‍රත්‍යය අතරට 'එ' යෙදිය යුතු ය.

බල + එ + න - බැලෙන
බල + එ + නු - බැලෙනු
බල + එ + නා - බැලෙනා
බල + ඒ - බැලේ

**2. අතීත කාල කර්ම කාරක**

අතීත කාල කර්ම කාරක ප්‍රත්‍ය සඳහා උණ හා උණු

මර + උණ - මැරුණ
රක් + උණ - රැකුණ

**3. භාව කාරක**

ක්‍රියාව සිදුවන බවට හැඟීමක් දැනවීම භාව කාරකයේ දී සිදුවේ. භාව කාරක කෘදන්ත ප්‍රත්‍යය පහකි.

නු උම් ඊම් ඉලි මන්

බල + නු - බලනු
බල + උම් - බැලුම්
බල + ඊම් - බැලීම්
බල + ඉලි - බැලලි

ලිය + මන් - ලියමන්

**4. ෂට් කාරක ප්‍රභේද**

ක්‍රියාවක් සමග සම්බන්ධ වන ආකාරය සලකා බලා කාරක සම්බන්ධ සය ආකාරයක් ලෙස දැක්වේ.

1. කර්තෘ කාරක
2. කර්ම කාරක
3. කරණ කාරක
4. සම්ප්‍රදාන කාරක
5. අවධි කාරක
6. ආධාර කාරක

**1. කර්තෘ කාරක**

ක්‍රියාව කරන්නේ කර්තෘ ය. කර්තෘ කාරකයෙන් ක්‍රියාවක කර්තෘ කියවෙයි.

උදා ඃ 1. **දරුවා** බත් කයි.
2. **වෙළෙන්දා** බඩු විකුණයි.

**2. කර්ම කාරක**

කර්තෘ අනුක්ත වීමෙන් හා කර්මය උක්ත වීමෙන් සැදෙන්නේ කර්ම කාරකයයි.

උදා ඃ විදුහල්පති විසින් **ශිෂ්‍යයෝ** අමතනු ලබත්

**3. කරණ කාරකය**

ක්‍රියාව සිදුකිරීමට හේතුවන/ උපකාරී වන දේ කරණයයි.

උදා ඃ ගොවියා **උදැල්ලෙන්** කුඹුර කොටයි.

**4. සම්ප්‍රදාන කාරක**

යම් දෙයක් ලබන්නා සම්ප්‍රදාන කාරකයෙන් යෙදේ.

උදා ඃ නංගි **යාචකයාට** බත් මුලක් දුන්නා ය.

**5. අවධි කාරක**

ක්‍රියාවට සම්බන්ධ වන සීමාව අවධි කාරකයෙන් කියවෙයි.

උදා ඃ නයා **තුඹසින්** එළියට එයි.

**6. ආධාර කාරක**

ක්‍රියාවේ සිද්ධියට අදාළ දරා සිටීම හෝ උසුළා සිටීම ආධාර කාරකයෙන් කියවෙයි.

උදා ඃ දුගියා **පැල්පතෙහි** වසයි.

**වාංමාලාව**

**සමානාර්ථ වචන**

සිංහල භාෂාවේ එක් එක් පදය සඳහා අර්ථයෙන් සමාන වූ පර්යාය පද රාශියක් ඉදිරිපත් කළ හැකි ය. එබඳු පද සමාන වචන වේ.

උදා ඃ අහස - අඹර, ආකාශය, ගගන, ගුවන, නුබ, පවන්මග, සුරමග

**විරුද්ධාර්ථ වචන**

කිසියම් පදයක අර්ථයට විරුද්ධ වූ අර්ථයක් යම් පදයකින් ඉදිරිපත් කෙරේ නම් එබඳු පද විරුද්ධාර්ථ පද වේ.

විරුද්ධාර්ථ වචන ක්‍රම තුනකට ඉදිරිපත් කළ හැකි ය.

1. කිසියම් පදයකට මුලින් උපසර්ගයක් යෙදීම.
   උදා ඃ යස - අයස
2. නිපාත පදයක් යෙදීම
   උදා ඃ හොඳ - නොහොඳ
   සමත් - අසමත්
   මිනිස් - නොමිනිස්
3. හාත්පසින් ම වෙනස් පදයක් යෙදීම
   උදා ඃ ස්වාධීන - පරාධිත
   නිශ්චල - චංචල

බහ්වර්ථ වචන

එක ම පදයකින් අර්ථ කිහිපයක් ප්‍රකාශ වේ නම් එබඳු පද බහ්වර්ථ වශයෙන් සැලකේ.

උදා ඃ සඳ - කාලය, මිත්‍රයා, උතුම්, සන්ධි, ඡන්දස්, සන්ධ්‍යාව, චන්ද්‍රයා
ඉසුරු - ඊශ්වර, නායක, ස්වාමියා, සම්පත, ධනවත්කම
කල් - ස්ත්‍රිය, යහපත්, කාලය, බිරිය

**පාරිභාෂික වචන**

භාෂාවක භාවිත වන පොදු වචන මාලාවෙන් පමණක් ඒ ඒ විෂයන්ට අයත් අදහස් හා සංකල්ප ප්‍රකාශ කිරීම දුෂ්කර කාර්යයකි. එබැවින් එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ අදහස් හා සංකල්ප ප්‍රකාශ කිරීම සඳහා භාවිත විශේෂ වචන මාලාවක් අවශ්‍ය වේ. මේවා පාරිභාෂික වචන ලෙස හැඳින්වේ.

දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, නීතිය, සාහිත්‍යය ආදී විවිධ විෂයන් සඳහා මෙලෙස පාරිභාෂික වචන භාවිත වේ.

**දේශපාපන විද්‍යාව**

ප්‍රජාතන්ත්‍රවාදය - බහුතරයකගේ කැමැත්ත මත සිදු කරන පාලනය
ව්‍යවස්ථාදායක - නීති සම්පාදනය කරන අයාතනය

**ආර්ථික විද්‍යාව**

ආවස්ථික පිරිවැය - යෝග්‍ය අවස්ථාවට අනුකූලව වියදම් සකස් කිරිම
උද්ධමනය - බඩු මිළ ඉහළ යාම

**නීතිය**

අපරාධය - යම් පුද්ගලයෙකුට හෝ යම් පුද්ගලයෙකුගේ දේපළවලට සිදු කරන යම් ආකාරයේ හානියක්
අභියාචනය - තමාට ලබාදුන් තීන්දුව නැවත සලකා බලන ලෙස නීත්‍යානුකූල වූ බලයලත් අධිකරණයකින් කරන විශේෂ ඉල්ලීම

**සාහිත්‍යය**

අනුප්‍රාසය - එක් අක්ෂරයක් හෝ වචනයක් නැවත නැවත ළඟ ළඟ යෙදීම අනුප්‍රාසයයි.
ව්‍යංග්‍යාර්ථ - ධ්වනිතාර්ථය හෙවත් ශබ්ද හා අර්ථ උපයෝගී කොට ගෙන මතු කෙරෙන සැඟවුණු අර්ථය

4

**අනුරූප වචන සංයෝග**

අර්ථය වෙනස් නොවන සේ සමරූපී වූ වචන සංයෝග යොදාගැනීම අනුරූප වචන සංයෝග වේ.

| | | |
|---|---|---|
| උදාහරණ | කර්තෘ වාක්‍යය | - කතුවැකිය |
| | විදේශ ප්‍රවෘත්ති | - විදෙස් පුවත් |
| | අභිෂේක මංගල්‍යය | - අභිසෙස් මඟුල |
| | අලුත් සහල් මංගල්‍යය | - අලුසල් මඟුල |

**වාක්‍යාංශ වෙනුවට යෙදිය හැකි තනි වචන**

විවිධාර්ථවත් පද කිහිපයක් සහිත වාක්‍යාංශයක් වෙනුවට එහි ඇතුළත් අර්ථ එක් රැස් කොට තනි වචනයෙන් ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| උදා | ඔටුනු පැළඳවීමේ උත්සවය | - අභිෂේකය |
| | ආහාරපාන හිඟ අවධිය | - දුර්භික්ෂය |

**භාෂා සම්ප්‍රදාය**

**රූඪී**
වචනාර්ථය ඉඩක්මවා යමින් සැඟවුණු අරුතක් ප්‍රකාශ කරන්නේ රූඪී මගිනි.

කණකොකා හඬලා - විනාශය ළංවෙලා
අත්වල හිරි ඇරගත්තා - රිසිලෙස පහර දුන්නා

**යුගල වචන**

වචන දෙකක් හෙවත් පද යුගලයක් එකට යෙදීම යුගල වචනයි. යුගල වචන නිර්මාණය කරගැනීමේ මූලික ක්‍රම කිහිපයකි.

1. සමානාර්ථ වචන යුගලයක් යොදාගැනීම.
   රට - රාජ්‍ය
   සමිති - සමාගම්
2. විරුද්ධ වචන යුගලයක් යොදාගැනීම
   දුක - සැප
   හොඳ - නරක
3. අර්ථ රහිත වූ වචන යුගලයක් යෙදීම
   ලට්ට - ලොට්ට
   අනං - මනං
4. අනුකරණාත්මක ශබ්ද රටාවක් සහිත අර්ථවත් වචන යුගලයක් යොදා ගැනීම.
   අඟර - දඟර
   නහින - දෙහින
5. වචන යුගලයේ පළමුවැන්න අර්ථවත් භාවයෙන් ද දෙවැන්න අර්ථවත් භාවයෙන් තොරව ද යෙදීම. මෙහි ශබ්ද සංඝටනාවක් ද පවතියි.
   බඩු - මුට්ටු
   ඔප්පු - තිරප්පු
6. පළමු වැන්නෙහි අර්ථයට සමීපවන සේ දෙවන වචනය යෙදෙයි. ශබ්ද සංඝටනාවක් පවතී.
   උදාහරණ වතු පිටි, ගේ දොර, හරක බාන

7. එකිනෙකට අසමාන පූර්ව ක්‍රියා දෙකක් එක් කිරීමෙන් සෑදෙන යුගල වචන

උදාහරණ සොයා - බලා, කවා - පොවා, කා - බී, ගයා - වයා

**ප්‍රස්තාව පිරුළු**

අවස්ථාවට ගැළපෙන කියමන් ප්‍රස්තාව පිරුළු නම් වේ. ප්‍රස්තාව පිරුළු බිහිවන ක්‍රම ගණනාවකි. කතා පුවතක් මුල්කරගෙන ප්‍රස්තාව පිරුළු බිහිවීම, පොතක තිබුණු යෙදුමක් ප්‍රස්තාව පිරුළු සේ භාවිත වීම. උපමා සේ ප්‍රස්තාව පිරුළු බිහිවීම ආදියයි.

**කතා පුවතක් මුල් කරගත් පිරුළු**

කළුවා මාරපන ගියා වගේ
කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

**පොතක තිබූ කියමනක් (ප්‍රකාශනයක්) ප්‍රස්තාව පිරුළු සේ යෙදීම.**

පය බරවායට පිටිකර බෙහෙත් බඳිනාසේ (සද්ධර්මරත්නාවලිය)
කිරි දියෙනි දෙවියත් - අඟුරු සුදුවන කලෙක් නම් නැත් (ගුත්තිල කාව්‍යය)

**උපමා මූලික ප්‍රස්තාව පිරුළු**

කබලෙන් ලිපට වැටුණා වගේ
වක්කඩේ හකුරු හැංගුවා වගේ

**උපභාෂා**

ප්‍රාදේශීය හා සමාජික වශයෙන් උප භාෂා දෙවර්ගයකට බෙදා දැක්විය හැකි ය. සිංහල භාෂාව ප්‍රාදේශීය වශයෙන් සුළු සුළු වෙනස්කම් දක්වයි. ඒ ඒ ප්‍රදේශයට ආවේණික භාෂා ව්‍යවහාර ප්‍රාදේශීය භාෂා සේ හැඳින්වේ.

**දිගාමඩුලු ජනවහර**

මරෙක් වෙනවා - මඟ හැරෙනවා
අංකොළ මිටියා - වළහා

**නුවර කලාවිය ජනවහර**

කුඩිත්තක්වත් - ස්වල්පයක්
කොටාබානවා - කනවා

**රුහුණේ ජනවහර**

දොඩනවා - කතා කරනවා
මක්කටෙයි - මොකටද

**වෙල්ලස්ස (ඌව) ජනවහර**

කෝලහිත - ලජ්ජාශීලී හිත
පනම්වෙනවා - යනවා

**සාමාජික උපභාෂා**

සමාජයේ විවිධ සමාජ කොටස් භාවිත කරන ව්‍යවහාර සාමාජික උපභාෂා ය.

**විශ්වවිද්‍යාලයීය උපභාෂාව**

පනාව දානවා - හිනාවෙනවා
ගිරවා දානවා - කටපාඩම් කරනවා

**ධීවර ජනවහර**

වළාලය - මුහුදේ රළ මඳවශයෙන් ඉහළ නැඟීම
තෙප්පම - කුඩා ඔරුව

"තරාතිරම, කුලය, ධනය, බලය ආදිය පාදක කොට ගෙන ඇති වන භාෂා ව්‍යවහාර වෙනස්කම් ද සාමාජික උපභාෂා ලෙස සැලකේ."

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියාකරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයිමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යෙදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනිමට යොදා ගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වයක් සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේදැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරිමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත්විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනිමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනිම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරිම මේ අනුව ගුරුවරුන්ගේ බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියාකරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන් ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවයෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයිම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

| | | | |
|---|---|---|---|
| 01. | පැවරුම් | 02 | ව්‍යාපෘති |
| 03. | සමීක්ෂණ | 04 | ගවේෂණ |
| 05 | නිරීක්ෂණ | 06 | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 07 | ක්ෂේත්‍ර චාරිකා | 08 | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09 | ව්‍යුහගත රචනා | 10 | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11 | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12 | ශ්‍රවණ පරීක්ෂණ |
| 13 | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14 | කථනය |
| 15 | ස්ව නිර්මාණ | 16 | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17 | සංකල්ප සිතියම් | 18 | ද්විත්ව සටහන් ජර්නල |
| 19 | බිත්ති පුවත්පත් | 20 | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21 | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22 | විවාද |
| 23 | සාකච්ඡා මණ්ඩප | 24 | සම්මන්ත්‍රණ |
| 25 | ක්ෂණික කථා | 26 | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය; වග බලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

| | |
|---|---|
| වාරය | 01 |
| ඇගයීම් සැලසුම් අංකය | 01 |
| නිපුණතාව | 3.0 |
| නිපුණතා මට්ටම | 3.1, 3.2 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |

**ක්‍රියාවලිය**

- විවෘත ග්‍රන්ථ පරීක්ෂණයක් සඳහා යෝග්‍ය ප්‍රශ්න 02ක් ගිරා සන්දේශය ඇසුරෙන් සකස් කරගන්න.
- එයින් එක් ප්‍රශ්නයක් විචාරය හා රසාස්වාදය පිළිබඳ ව ද අනෙක් ප්‍රශ්නය නිර්මාණකරණය පිළිබඳ ව ද විය යුතු ය.
- නිශ්චිත වේලාවක් තුළ දී පන්ති කාමරය තුළ දී පිළිතුරු ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන්ට අවශ්‍ය ඕනෑම පොතක් පිළිතුරු ලිවීමේ කාලය තුළ දී භාවිත කළ හැකි බව පවසන්න.

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | පිළිතුරුවල ප්‍රමාණවත් බව හා සාරවත් බව | සංවිධානාත්මක බව | උචිත උදාහරණ දක්වා තිබීම | සම්මත ලේඛන රීති අනුගමනය කිරීම | පිළිතුරුවල අංග සම්පූර්ණ බව |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04යි |
| හොඳයි | 03යි |
| මධ්‍යස්ථයි | 02යි |
| සංවර්ධනය විය යුතු යි | 01යි |

**වාරය** 01

**ඇගයීම් සැලසුම් අංකය** 02

**නිපුණතාව** 5.0

**නිපුණතා මට්ටම** 5.1, 5.2

**ඇගයීම් සැලසුම් ස්වාභාවය** කෙටිකතා නිර්මාණ සංග්‍රහයක් (කණ්ඩායම් ක්‍රියාකාරකම්)

**ක්‍රියාවලිය**

- කෙටිකතා ලිවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම කරන්න.
- තෝරාගත් තේමාවකට අදාළ ව කෙටිකතා නිර්මාණය කිරීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න. සෑම ශිෂ්‍යයෙක්ම එක් කෙටිකතාවක් බැගින්වත් නිර්මාණය කළ යුතු ය.
- කණ්ඩායම් සාමාජිකයන් ලියන ලද කෙටිකතා එකතු කර කෙටිකතා නිර්මාණ සංග්‍රහයක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | කෙටිකතාවල නිර්මාණාත්මක බව | කෙටිකතා ලිවීමේ ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම | භාෂා භාවිතය | උචිත බව | කණ්ඩායම් තුළ සාමූහිකව කටයුතු කිරීම |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04යි |
| හොඳයි | 03යි |
| මධ්‍යස්ථයි | 02යි |
| සංවර්ධනය විය යුතු යි | 01යි |

වාරය 01

**ඇගයීම් සැලසුම් අංකය** 03

**නිපුණතාව** 6.0

**නිපුණතා මට්ටම** 6.1, 6.2, 6.3, 6.4

**ඇගයීම් සැලසුම් ස්වාභාවය** කේවල රචනා සංග්‍රහයක් ඉදිරිපත් කිරීම

**ක්‍රියාවලිය**

- 13 වන ශ්‍රේණියට උචිත රචනා මාතෘකා 20ක් අඩංගු ලැයිස්තුවක් කල් ඇතිව ලබා දෙන්න.
- අභිමත රචනා මාතෘකා 10කට අනුව ලියන ලද කේවල ගද්‍ය රචනා සංග්‍රහයක් සැකසීමට පවරන්න.
- වරින් වර සිසුන්ගේ රචනා පරීක්ෂා කරන්න.

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | මාතෘකාවට අදාළ විෂය කරුණුවල වැදගත්කම | සංවිධානය, ඡේද බෙදීම, අනුපිළිවෙල හා විවිධ උපක්‍රම භාවිත කිරීම | භාෂාවේ නිවැරදිබව, අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ, නිර්මාණශීලී බව | නිගමනවලට එළඹීම, සාධාරණීකරණය තර්කානුකූලව ඉදිරිපත් කිරීම. | නිරන්තර උපදෙස් ලබා ගැනීම හා පිළිපැදීම |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි 04යි
හොඳයි 03යි
මධ්‍යස්ථයි 02යි
සංවර්ධනය විය යුතු යි 01යි

| | |
|---|---|
| **වාරය** | 02 |
| **ඇගයීම් සැලසුම් අංකය** | 01 |
| **නිපුණතාව** | 1.0, 2.0 |
| **නිපුණතා මට්ටම** | 1.1, 2.1, 2.2 |
| **ඇගයීම් සැලසුම් ස්වාභාවය** | විවාද තරගයක් |
| **ක්‍රියාවලිය** | |

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර විවාද තරගයක් පවත්වන්න.
- මේ සඳහා පහත සඳහන් මාතෘකා හෝ වෙනත් එවැනි මාතෘකා හෝ යොදාගන්න.
  1. වඩා යහපත් ජීවන අත්දැකීම් ලබාදෙන්නේ නූතන ගද්‍ය සාහිත්‍යයි/ පුරාතන සාහිත්‍යය.
  2. නිර්මාණාත්මක සාහිත්‍යමය ලක්ෂණ වඩාත් ප්‍රකට වන්නේ නූතන සාහිත්‍යයයි/ පුරාතන සාහිත්‍යයයි

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | සංවිධානය හා පෙර සූදානම | මනා කරීකත්වය ප්‍රදර්ශනය කිරීම | තර්කානුකූල ව කරුණු ගෙනහැර දැක්වීම | ප්‍රතිතර්ක ඉදිරිපත් කිරීම | කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04යි |
| හොඳයි | 03යි |
| මධ්‍යස්ථයි | 02යි |
| සංවර්ධනය විය යුතු යි | 01යි |

| | |
|---|---|
| වාරය | 02 |
| ඇගයීම් සැලසුම් අංකය | 02 |
| නිපුණතාව | 4.0 |
| නිපුණතා මට්ටම | 4.1, 4.2 |
| ඇගයීම් සැලසුම් ස්වාභාවය | නිර්මාණ සංග්‍රහයක් |

**ක්‍රියාවලිය**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- කවි ලිවීම සඳහා සිසුන් යොමුකරන්න.
- එක් කණ්ඩායමකින් එක් නිර්මාණ සංග්‍රහයක් බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- සෑම ශිෂ්‍යයෙකුගේ ම නිර්මාණයක් නිර්මාණ සංග්‍රහයට ඇතුළත් විය යුතු බව පවසන්න.

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | කවිවල නිර්මාණාත්මක බව | වස්තු විෂයේ උචිත බව | කවි ලිවීමෙහි ශිල්පක්‍රම අනුගමනය කිරීම | බස නිවැරදි ව පරිහරණය කිරීම | නිර්මාණ සංග්‍රයේ සමස්ත නිමාව |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04යි |
| හොඳයි | 03යි |
| මධ්‍යස්ථයි | 02යි |
| සංවර්ධනය විය යුතු යි | 01යි |

**වාරය** 02

**ඇගයීම් සැලසුම් අංකය** 03

**නිපුණතාව** 6.0

**නිපුණතා මට්ටම** 6.4

**ඇගයීම් සැලසුම් ස්වාභාවය** දැනුම මිනුම තරගයක්

**ක්‍රියාවලිය**

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන්කරන්න.
- සිංහල වාංමාලාව හා භාෂා සම්ප්‍රදාය ඇසුරෙන් දැනුම මිනුම තරගයට අදාළ ව ප්‍රශ්න සකස් කිරීමට උපදෙස් දෙන්න.
- සිසු කණ්ඩායම් දෙක අතර දැනුම මිනුම තරගයක් පවත්වන්න.

**ඇගයීම් නිර්ණායක**

| නිර්ණායක / සිසුන්ගේ නම | පෙර සූදානම හා සංවිධානය | උචිත ප්‍රශ්න සකස් කිරීම | නිවැරදි හා නිරවුල් පිළිතුරු ලබාදීම | පිළිතුරු සඳහා ඉදිරිපත් වීම | උපදෙස් පිළිපැදීම |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 04යි |
| හොඳයි | 03යි |
| මධ්‍යස්ථයි | 02යි |
| සංවර්ධනය විය යුතු යි | 01යි |